ස්ථානීය පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම
(SSE & SMP)

# ආපදා ස්ථානීය අංක 04
# කුමරි කන්ද
# කළුතර දිස්ත්‍රික්කය - ගොනු අංක 08
# 2018 ඔක්තෝබර්

ශ්‍රී ලංකා නායයාම් අවම කිරීමේ ව්‍යාපෘතිය
ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව
(AIIB)

සැකසුම:
පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
99/1, ජාවත්ත පාර
කොළඹ 05

Tel: 011-2588946, 011-2503431, 011-22500354

## පටුන

1. හැඳින්වීම ........................................................................................................1

2. නායයෑම් සිදුවූ ස්ථානයේ තොරතුරු සහ පිහිටීම පිළිබඳ විස්තරය ..............................1

3. නායයෑම් ව්‍යයසනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු ..................................................2

4. පවතින අවදානම අවම කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග ........................4

5. නාය ප්‍රදේශය හා නාය අවට ප්‍රදේශය පිළිබඳ විස්තර හා වර්තමාන අවධානම් මට්ටම.........4

6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑම් ඇතිවිය හැකි අවට පරිසරයේ සංවේදී ඒකකයන් පිළිබඳ කෙටි හැඳින්වීමක්..........................................................................6

7. ව්‍යාපෘතිය යටතේ යෝජිත පිළිසකර කිරීමේ ක්‍රියාමාර්ගයන් ......................................6

8. ව්‍යාපෘති ප්‍රදේශය හා සම්බන්ධ සමාජ, පාරිසරික බලපෑම් හා අවදානම් හඳුනා ගැනීම .......6

8.1 හිතකර බලපෑම ...............................................................................................6

8.2 අහිතකර බලපෑම..............................................................................................6

8.2.1 ඉඩම් වලට හා ඉදිරි සංවර්ධන කටයුතු සඳහා පිවිසුම් මාර්ග අවහිර වීම......................6

8.2.2 ශාක හා සත්වයින්ට සිදුවිය හැකි පාරසරික හා ජීව විද්‍යාත්මක බලපෑම ......................7

8.2.3 ප්‍රදේශයේ ජලවහන රටාවට සිදුවිය හැකි බලපෑම..................................................7

8.2.4 පාංශු ඛාදනයේ බලපෑම සහ ගංගා පතුලේ සිදුවන වෙනස්වීම .................................7

8.2.5 ඉදිකිරීම් කටයුතු නිසා සිදුවන ජල දූෂණය මගින් ඇතිවිය හැකි බලපෑම.....................7

8.2.6 ඉදිකිරීම් කාලසීමාවේ දී අක්‍රමවත් (එලිමහන් ස්ථාන වල) වැසිකිලි භාවිතය නිසා ජලයට අපද්‍රව්‍ය එකතු වීමට ඇති ඇති හැකියාව ......................................................7

8.2.7 පහල ගංගා ප්‍රදේශයේ ජලය භාවිත කරන්නන්ට සිදුවන බලපෑම ..............................7

8.2.8 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළු .....................................................................7

8.2.9 වායු දූෂණය හා සම්බන්ධ ගැටළු ......................................................................7

8.2.10 ඉදිකිරීම් වලදී ඇතිවන ශබ්දය දූෂණය, කම්පන, පිපිරීම් වැනි තත්ත්වයන් හේතුවෙන් ගොඩනැගිලි වලට හා යටිතල පහසුකම් වලට සිදුවිය හැකි හානි...........................8

8.2.11 වැඩබිමේ සේවකයින් හා අවට ප්‍රදේශවාසීන් අතර ඇතිවිය හැකි නොසන්සුන් තත්ත්වයන්.....8

8.2.12 සේවක නේවාසික කඳවුරු සහ අනෙකුත් ස්ථානීය අවශ්‍යතාවයන්.............................8

8.2.13 ඉදිකිරීම් අතරතුර ප්‍රදේශවාසීන් වැඩබිමට පිවිසීම හේතුවෙන් ඔවුන්ට මුහුන දීමට සිදුවිය හැකි අවධානම් තත්ත්වයන්..............................................................................8

8.2.14 පුපුරණ ද්‍රව්‍ය සහ එවැනි වෙනත් අනතුරුදායක ද්‍රව්‍ය හේතුවෙන් ඇතිවිය හැකි අවධානම් තත්ත්වයන් .....................................................................................................8

8.2.15 ඉදිකිරීම් කටයුතු හා මහජන ආරක්ෂාව :මාර්ගය භාවිතා කරන මගීන්ට ඇති අවධානම ..........8

8.2.16 ව්‍යාපෘති කාල සීමාව තුල සේවක ආරක්ෂාව ......................................................9

9. මහජනතාව, අනෙකුත් පාර්ෂවකරුවන් වෙනුවෙන් පවත්වා ඇති හෝ පැවැත්වීමට නියමිත උපදේශන සේවාවන්. .........................................................................................9

9.1 අදාල පාර්ෂවකරුවන් සමග පැවති උපදේශන සේවාවන් වලදී ඇති වූ එකඟතාවයන් හා නිර්දේශයන් (යොමුව: ඇමුණුම I - උපදේශන සේවා) ..................................................9

10. විශේෂිත පාරිසරික හා සමාජීය බලපෑම්: ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ විශේෂිත ක්‍රියාමාර්ග හෝ මැදිහත්වීම් අවශ්‍ය වන සමාජ, පාරිසරික බලපෑම් හෝ අවදානම් ඇතිවන අංශයන්..9
10.1 ජලය හෝ තෙත් බිම් සඳහා වන බලපෑම් (ඇල මාර්ග වල අපද්‍රව්‍ය එකතු වීමෙන් සිදුවන ගැටළු). නායයාම් ස්ථානයේ ඉදිකිරීම / පිළිසකර කිරීම තුළින් දිගුකාලීන බලපෑම් සහ වියහැකි බලපෑම සහ අවදානම් තත්ත්වය ....9
10.2 ඛාදන ක්‍රියාවලිය ආශ්‍රිත බලපෑම් හා ගංගා පතුලේ සිදුවන වෙනස්වීම්....10
10.3 ප්‍රවාහන හා යටිතල පහසුකම් වලට සිදුවන බලපෑම (විශේෂයෙන් තාවකාලිකව පිවිසුම් මාර්ග හා දුම්රිය මාර්ග අහිමි වීම, වාහන තදබදය) ....10
10.4 පොදු සේවා සැපයීමේදී පහල ප්‍රදේශයට සිදුවන බලපෑම (ජල සැපයුම, අපද්‍රව්‍ය ඉවත් කිරීම, විදුලිය සැපයීම, ආදිය)....10
10.5 සත්ව හා ශාක විශේෂ වලට සිදුවන පාරිසරික, ජෛව විද්‍යාත්මක බලපෑම් ....10
10.6 ප්‍රදේශයේ ජලවහන රටාව මත ඇති කරන බලපෑම....10
10.7 ඉදිකිරීම් කාලසීමාවේ දී අක්‍රමවත් (ඒලිමහන් ස්ථාන වල) වැසිකිලි භාවිතය නිසා ජලයට අපද්‍රව්‍ය එකතු වීමට ඇති ඇති හැකියාව ....10
10.8. ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ජලය අපවිත්‍ර වීම ....10
10.9 ඉදිකිරීම් භූමියට ආසන්නව වාසය කරන ඉහල හා මධ්‍ය වශයෙන් අතිවිය හැකි අවධානම් තත්ත්වයන් (නාය ඉහල ප්‍රදේශය, පහල ප්‍රදේශය හා පහල ගංගා නිම්න ප්‍රදේශය) ....10
10.10 නැවත ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශය තුල පිහිටා ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙක් ස්ථාන ....10
10.11 නාය ස්ථානයට අසලින්ම පිහිටි ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙක් ස්ථාන....10
10. 12 වැඩබිම තුලට සාමාන්‍ය පුද්ගලයින් ඇතුල් වීමේ හෝ හරහා ගමන් කිරීමේ අවශ්‍යතාවය....10
10.13 සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ ගැටළු - කොන්ත්‍රාත්කරුවන් සඳහා සම්මත ගිවිසුම් ඉක්මවා යන විශේෂිත H & S (සෞඛ්‍ය හා සුරක්ෂිතතා) ක්‍රමවේදයන්. ....11
10.15 ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය යොදා ගැනීම ....11
11. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන අනුමැතීන් සහ විරෝධතා නොමැති බව ....11
11.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ....11
11.2 අදාල ස්ථානයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන අනුමැතිය....11
11.3 මධ්‍යයම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු අනුමැතිය. ....11
11.4 වෙනත් අනුමැතීන්....11
11.5 පුද්ගලික ඉඩම් හිමිකරුවන්ගෙන් අනුමැතිය ගැනීම / විරෝධතා නොමැති බව/ නීත්‍යානුකූලව බැඳුණු එකඟතාවයන්. ....12
12. පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්ම (ESMP) ....12
12.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ....12
12.2 ජනතාව ඉවත් කිරීම ....13
12.3 හානියට පත් භෞතික ව්‍යුහයන් , යටිතල පහසුකම් ඉවත් කිරීම සඳහා ක්‍රියා පටිපාටිය ....13
12.4 ව්‍යාපෘති කටයුතු හේතුවෙන් දේපල අහිමි - භාවිතයන් -හානි වීම් සඳහා වන වන්දි ඉල්ලාසිටීම්13
12.5 පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කල යුතුය ...13
12.6 සැලසුම් මත පදනම් වූ පාරිසරික /සමාජ කළමනාකරණ ක්‍රවේදයන් සලකා බැලීම. ....13
12.7 ඉදිකිරීම් අදියර අතරතුර බලපෑම් අවම කිරීම....13

12.7.1 ඉදිකිරීම් අදියර තුළ කොන්තාත්කරුවන්ගේ පාරිසරික හා සමාජ කළමනාකරණ අනුකූල වීම සඳහා වන ප්‍රමිතීන් ....15
12.7.2 ස්ථානීය හානි අවම කිරීම ....16
13. ව්‍යාපෘති ස්ථානය අධීක්ෂණය කිරීම ....19
14. දුක් ගැනවිලි වලට සවන් දීම ....20
15. තොරතුරු අනාවරණය කිරීම ....20

## ඇමුනුම් ලැයිස්තුව

ඇමුණුම **I:** ආපදා තත්ත්වයේ ස්වභාවය හා උපදේශන අවස්ථා ....**i**
ඇමුණුම **II:** පාර්ශවකරුවන් සමග පැවැත්වූ සාකච්ඡා තුලදී අනාවරණය වූ විශේෂ කරුණු - කළුතර දිස්ත්‍රික්කය ....**ii**
ඇමුණුම **III:** අධ්‍යයන කණ්ඩායම ....**ii**
ඇමුණුම **IV:** විමර්ශන ලැයිස්තුව ....**ii**

## රූපසටහන් ලැයිස්තුව

රූපය 1: යෝජිත නායයාම් අවම කිරීමේ ස්ථානයේ ගූගල් ඡායාරූපය ....2
රූපය 2a: කඩා වැටී ඇති බැවුම් කොටස ....3
රූපය 2b: දිස්ත්‍රික් කම්කරු කාර්යාල ගොඩනැගිල්ල සහ කන්ද අතර ප්‍රදේශයේ පහලට කඩා වැටුණු පස් සහ සුන්බුන් තැන්පත් වී ඇති ආකාරය. ....3
රූපය 2c: පහල බැවුම් ප්‍රදේශය සහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ....3
රූපය 2d: කොටසක් කඩා වැටුණු සිරස් රැඳවුම් බිත්තිය. ....3
රූපය 2e: අවදානමක් සහිත අවුස ගොඩනැගිල්ල (කුමරි කන්දේ ඉහල ප්‍රදේශය) ....3
රූපය 2f: අවදානමක් සහිත පහල බැවුම් ප්‍රදේශයේ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ....3
රූපය 3: නායයෑම සිදුවූ ප්‍රදේශයේ භෞතික ලක්ෂණ සහ පිහිටීම පිළිබඳ දළ රූප සටහන ....4

## වගු ලැයිස්තුව

වගුව 1: අනුමැතීන් ලබා ගැනීම සඳහා නියමිත කාල නියමය ....12
වගුව 2 : සැලසුම් අදියරේදී පාරිසරික හා සමාජීය කරුණු සලකා බැලීම ....13
වගුව 3: ES & HS සමඟ අනුකූල වීම සඳහා කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතාව ....15
වගුව 4: ස්ථානීය ES & HS අවම කිරීම සඳහා ගනුලබන පියවර ....16

## කෙටි යෙදුම්

| | |
|---|---|
| AIIB | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව<br>Asian Infrastructure Investment Bank |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය<br>Central Environmental Authority |
| DFC | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>Department of Forest Conservation |
| DS | ප්‍රාදේශීය ලේකම්<br>Divisional Secretary |
| DWLC | වන ජීවි දෙපාර්තමේන්තුව<br>Department of Wild Life Conservation |
| EH & S | පරිසර හා සමාජ ආරක්ෂණ<br>Environmental Health & Social |
| E & SU of PMU | පාරිසරික සමාජ ආරක්ෂණ හා ව්‍යාපෘති කළමනාකරණ අංශය<br>Environmental & Social Unit of Project Management Unit |
| E & S & H & S unit of PMU | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික හා සමාජ සහ සෞඛ්‍යය සහ ආරක්ෂක ඒකකය<br>Environmental & Social & Health & Safety Unit of Project Management Unit |
| ESMF | පාරිසරික හා සමාජ කළමනාකරණ රාමුව<br>Environmental and Social Management Framework |
| ESMP | පාරිසරික සමාජ කළමනාකරණ සැලැස්ම<br>Environmental Social Management Plan |
| SSE & SMP | නිශ්චිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම<br>Site Specific Environmental and Social Management Plan |
| GN | ග්‍රාම නිලධාරී<br>Grama Niladhari |
| GOSL | ශ්‍රී ලංකා රජය<br>Government of Sri Lanka |
| GSMB | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය<br>Geological & Mines Bureau |
| NBRO | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය<br>National Building Research Organization |
| RDA | මාර්ග සංවර්ධන අධිකාරිය<br>Road Development Authority |

1. හැදින්වීම

ශ්‍රී ලංකා රජය ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) හා සම්බන්ධ වෙමින් එම බැංකුවේ මුල්‍ය ආධාර මත ශ්‍රී ලංකාවේ පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක නාය යෑම් සිදුවන සථාන පිළිසකර කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය පරිසරික හා සමාජ ආරක්ෂණමය වශයෙන් AIIB බැංකුවේ හා ලංකා රජයේ නීතිරීතිවලට අනුකූලව සිදුවිය යුතුය. ව්‍යාපෘතියේ ස්වභාවය සහ එහි ක්‍රියාවලිය සැලකිල්ලට ගනිමින් AIIB බැකුව අපේක්ෂා කරන පරිදි ඔවුන්ගේ පාරිසරික හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදි පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවක් (ESMF) සකසා ඇත.

පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවහි (ESMF) අරමුණු වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී AIIB බැංකුවේ ආරක්ෂණ ක්‍රමවේද සහ ජාතික පාරිසරික හා සමාජ ප්‍රඥප්තිය පිළිබද මාර්ගොපදේශයන් සැපයීමයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන්; ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (ජා.ගො.ප.ස.) සමස්ත ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කරණු ලබන පාරිසරික හා සමාජීය කළමනාකරණ රාමුව, ව්‍යාපෘතියට අදාල පාර්ශවයන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පාරිසරික , සමාජ , සෞඛ්‍ය හා ආරක්ෂණ තත්ත්වයන් ව්‍යාපෘති ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන බැවින් එවැනි වෙනස් වන නිශ්චිත තත්වයන් පිළිබද අවධානය යොමු කිරීම වැදගත් වේ. එමනිසා පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවට අනුව පාරිසරික සහ සමාජයීය ඇගයීම් සඳහා එක් එක් නායයාම් ස්ථානයට විශේෂිත වූ පාරිසරික හා සමාජ කළමනාකරණ වාර්තා (SSE & SMP) සකසා ඇත. එම ස්ථානයේ විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණය පිළිබද සැළසුම් මගින් විශේෂිත පිළිසකර ක්‍රමවේදයන්, සෞඛ්‍ය, සමාජ සහ ආරක්ෂණ කළමනාකරණය සම්භන්දයෙන් සලකා බැලිය යුතු අංශයන් පිළිබද ඉදිකිරීම් සහ මෙහෙයුම් කාලය තුල අවශ්‍ය මග පෙන්වීම් ලබාදෙනු ඇත.
කළුතර දිස්ත්‍රික්කයේ කුමරි කන්ද අසල නායයාම් අවම කිරීම සඳහා යෝජිත ආපදා ස්ථානයකි. එම ස්ථානය සඳහා විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්මක් සකස් කර ඇත. ගැඹුරු පාරිසරික හා සමාජ අධ්‍යයවකින් පසුව මෙම සැලැස්ම සකස් කර ඇත.

i. ව්‍යාපෘතියට අදාල කලාපයේ සංවේදී පාරිසරික හා සමාජීය අංග හඳුනා ගැනීම.
ii. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සැලකිය යුතු පාරිසරික හා සමාජීය බලපෑම් හඳුනා ගැනීම.
iii. හානිය අවම කරන පියවර යෝජනා කිරීම.
iv. මෙම ව්‍යාපෘතියට අදාල වන පාරිසරික සහ සමාජ නිරීක්ෂණ අවශ්‍යතා තීරණය කිරීම.
v. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතරතුර අදාළ පාරිසරික නියාමයන් හා ක්‍රියාපටිපාටීන් අධ්‍යනය කිරීම

## 2. නායයෑම් සිදුවූ ස්ථානයේ තොරතුරු සහ පිහිටීම පිළිබඳ විස්තරය

ස්ථාන අංක 04, ගොනු අංකය-8, කළුතර දිස්ත්‍රික්කය, කුමරි කන්ද අසල නායයාම.

ස්ථානීය තොරතුරු

i. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කළුතර දකුණ ග්‍රාම නිලධාරී වසම යටතේ පරිපාලනමය කටයුතු සිදු කෙරේ.
ii. මෙම ස්ථානයට ආසන්නතම නගරය වන්නේ කළුතර නගරයි, එය 720 m ක් පමණ දුරින් පිහිටා ඇත.
iii. ස්ථානියයේ GPS අගය 6·345831 N, 80·575198 E. (යොමුව: රූපය 1. ස්ථානයේ ගූගල් ඡායාරූපය.)
iv. ඉඩම් හිමිකාරීත්වය කම්කරු දෙපාර්තමේන්තුවටත් සහ කුමරි කන්ද ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයටත් පවතී.




රූපය 1: යෝජිත නායයාම් අවම කිරීමේ ස්ථානයේ ගූගල් ඡායාරූපය.

## 3. නායයෑම් ව්‍යයසනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු

අධික වර්ෂාපතනය හේතුවෙන් 2017 මැයි මාසයේදී මෙම ස්ථානයේ බෑවුම නායයාමකට ලක්වී ඇත. මෙම අස්ථායී බෑවුම නැවත ඇතිවන අධික වර්ෂාපතන තත්වයන් සමග කඩා වැටීමකට ලක් වී ඇත. කුමරි කන්දේ මුදුන ප්‍රදේශයෙන් මෙම කඩා වැටීම ආරම්භ වී ඇති අතර (ඉහල බෑවුමේ ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ මායිම් ප්‍රදේශයෙන්) පහලට කඩා වැටුණු පස් සහ සුන්බුන් බෑවුමේ පහළ ප්‍රදේශයට යාබදව පිහිටි දිස්ත්‍රික් කම්කරු කාර්යාල පරිශ්‍රය වෙත ගලාගොස් එම පරිශ්‍රය සහ කන්ද අතර ප්‍රදේශයේ  තැන්පත් වී ඇත.

අවිධිමත් සිරස් කැපීම් මෙම බෑවුමේ අස්ථායීතාවයට  ප්‍රධාන හේතුව වේ. ගොඩනැගිලි ඉදි කිරීමට ඉඩකඩ ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් කම්කරු කාර්යාල පරිශ්‍රයේ  මායිමෙන් මීටර් 150 ක් දිග දිග සිරස් කැපීම සිදු කර ඇත. බෑවුමේ ස්ථාවරත්වය සඳහා ඉදි කර ඇති සිරස් බිත්තිය නිසි ප්‍රමිතියකින් තොර වන අතර දුර්වල ජලාපවහන කළමනාකරණය සහ පාදම අදාරය ඉවත් කිරීම නිසා නාය යාම සඳහා සුදුසු තත්වයන් නිර්මාණය වීම තුලින් කන්දේ ඉහල සහ පහල ගොඩනැඟිලිවලට මෙන්ම එම ප්‍රදේශ පරිහරණය කරන ජනතාවටද  තර්ජනයක් වී ඇත.

සිදුව ඇති හානියේ ස්වාභාවය

රඳවා තබා ගැනීමේ බිත්තියේ කොටසකට නාය යාම මගින් හානි වී ඇති අතර**,** කම්කරු දෙපාර්තමේන්තුවේ ගොඩනැඟිල්ලට කිසිදු හානියක් සිදු වී නොමැත. නැවත නැවත කඩා වැටෙන සුන්බුන් මගින් සිරස් කැපීම හා දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල අතර බිම් තීරය අවහිර වී ඇත. ශ්‍රී සුදර්ශනාරාමයේ නේවාසික ස්වාමින්වහන්සේට අනුව සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ ස්ථාන භාර නිලධාරී මහතාට අනුව ඉහල බෑවුම් ප්‍රදේශයේ  ආතති පැලුම් සහ විහාරස්ථානයේ ආවාස ගොඩනැගිල්ලේ ඉරිතලුම් සිදු වී ඇත. මෙම නාය යාම හේතුවෙන් බෑවුමේ ඉහල ප්‍රදේශයේ  ඇති තාවකාලික කුටියකට හානි සිදුවී තිබේ. සිදුවීම හේතුවෙන් කිසිදු ජීවිත හානියක් සිදුවී නැත. යොමුව රූපය 2: ව්‍යාපෘති ප්‍රදේශයේ  ජායාරූප.

| | |
|---|---|
|  |  |
| රූපය *2a:* කඩා වැටී ඇති බෑවුම් කොටස | රූපය *2b:* දිස්ත්‍රික් කම්කරු කාර්යාල ගොඩනැගිල්ල සහ කන්ද අතර ප්‍රදේශයේ පහලට කඩා වැටුණු පස් සහ සුන්බුන් තැන්පත් වී ඇති ආකාරය. |
|  |  |
| රූපය *2c:* පහල බෑවුම් ප්‍රදේශය සහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය | රූපය *2d:* කොටසක් කඩා වැටුණු සිරස් රැඳවුම් බිත්තිය. |
|  |  |
| රූපය 2e: අවදානමක් සහිත අවැස ගොඩනැගිල්ල (කුමරි කන්දේ ඉහල ප්‍රදේශය) | රූපය *2f:* අවදානමක් සහිත පහල බෑවුම් ප්‍රදේශයේ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය |

රූපය 2c : ව්‍යාපෘති ප්‍රදේශයේ ඡායාරූප




රූපය *3:* නායයෑම සිදුවූ ප්‍රදේශයේ භෞතික ලක්ෂණ සහ පිහිටීම පිළිබඳ දළ රූප සටහන

## 4. පවතින අවදානම අවම කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග

මෙම සිදුවීමෙන් පසුව කම්කරු දෙපාර්තමේන්තුව මගින් කරන ලද ඉල්ලීමකට අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් එම ස්ථානය පරීක්ෂා කර අවදානම තක්සේරු කර තිබේ. NBRO හි කළුතර දිස්ත්‍රික් කාර්යාලයට අනුව**,** ඉහල බෑවුම් ප්‍රදේශය තුළ ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ ගොඩනැගිලිවල ඉරිතැලීම් හා ආතති පැළුම් මගින් ඉහල අස්ථාවර තත්වයක් ඇති වී තිබේ. කළුතර දිස්ත්‍රික් කම්කරු දෙපාර්තමේන්තු කාර්යාලයට සහ විහාරස්ථානයේ ස්වාමීන්වහන්සේට මෙහි අවදානම් මට්ටම පිළිබඳ දැනුම් දී ඇත. අධික වර්ෂාපතනයේ දී ගොඩනැගිලි වලින් ඉවත් වීමටත් NBRO හි පෙර අනතුරු ඇඟවීමේ සංඥා වලට ප්‍රතිචාර දක්වන ලෙසත් උපදෙස් ලබා දී ඇත.

**ඉවත් කිරීම්:** ජා.ගො.ප.ස. විසින් දැනුම් දෙන ලද අවදානම මත දිස්ත්‍රික් කම්කරු දෙපාර්තමේන්තු කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල කාර්යාල අංශය ඉවත් කර ඇත.

## 5. නාය ප්‍රදේශය හා නාය අවට ප්‍රදේශය පිළිබඳ විස්තර හා වර්තමාන අවධානම් මට්ටම

### පිහිටීම

අස්ථායී වූ බෑවුම සාපේක්ෂ වශයෙන් තැනිතලා ප්‍රදේශයක පිහිටා ඇති "කුමරි කන්ද" නම් හුදකලා කඳුගැටයක සිදු වී ඇත. තැනිතලා භූමි ප්‍රදේශය බොහෝ දුරට නාගරික ජනාවාස ප්‍රදේශයකි. පාසල් සහ රජයේ ආයතන**,** කෝවිල මෙම ප්‍රදේශය තුළ පිහිටා ඇත. කඳු මුදුනේ " ශ්‍රී සුදර්ශනාරාම බෞද්ධ විහාරස්ථානය" පිහිටා ඇත. මෙම නාය ස්ථානයට ඇති ප්‍රධාන පිවිසුම් මාර්ග වන්නේ පරණ ගාලු පාරයි. වර්තමානයේ එය ශ්‍රීමත් සිරිල් ද සිල්වා මාවත ලෙස හැඳින්වේ. මෙම මාර්ගය සහ කොළඹ ගාල්ල **(A2)** ප්‍රධාන මාර්ග එකිනෙකට සමාන්තරව ගමන් කරයි. **A2** මාර්ගයේ ප්‍රධාන මාර්ගයේ සිට මෙම මාර්ගයට ප්‍රවේශ මාර්ග කිහිපයක් ඇත.

**ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානය (ඉහල බෑවුම් ප්‍රදේශය)**

කඳු මුදුනේ පිහිටා ඇති ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයට වැදගත් පුරාවෘත්ත ඉතිහාසයක් ඇත. වසර 300 කට පෙර මෙම කඳුවැටිය ඉන්දියාවේ සිට පැමිණි සොලීන්ගේ බලකොටුවක් බවට පත් වූ අතර ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය ඔවුන් ආක්‍රමණය කළේය. මෙම ප්‍රදේශය පාලනය කළ වික්‍රමපන්ඩය රජු විසින් මෙම කඳු මුදුනේ ඉදිකරන ලද බලකොටුවක ඔහුගේ කුමරිය ජීවත් විය. මෙම හේතුව නිසා මෙම කඳුගැටය "කුමරි කන්ද" ලෙස හැඳින්වේ.

සොලී පාලන කාල සීමාවෙන් පසු, මෙම ස්ථානය විහාරස්ථානයක් බවට පත් වූ අතර සොලීන් විසින් විනාශ කරන ලද කළුතර ලංකා තිලක විහාරයේ (වර්තමාන පූජනීය කළුතර විහාරය) නටබුන් මෙහි තැන්පත් කර ඇත. දිස්ත්‍රික්කයේ පැරණිතම විහාරස්ථානය වන්නේ කුමාරි කන්ද විහාරස්ථානයයි. පැරණි ලංකාතිලක විහාරයේ සිට ගෙන එන ලද ඓතිහාසික නටබුන් රසක් තවමත් විහාරස්ථානයේ ඉතිරිව පවතින අතර එයට සන්ටාර සහ ගල් කැටයම් ඇතුළත් වේ. දේශීය තොරතුරු අනුව, ප්‍රසිද්ධ කළුතර බෝධි වෘක්ෂය හා කුමාරිකන්ද විහාරස්ථානයේ බෝධි වෘක්ෂය එකම වයස සහිත ගස් විය. මෙම ඓතිහාසික බෝධි වෘක්ෂය වික්‍රමපාන්ඩය රජු විසින් බෙරමයෙන් රැගෙන විත් ඇත. 1950 දශකය තුළ මෙම භික්කුස් පිරිවෙන මනාව ක්‍රියාත්මක වූ බෞද්ධඅධ්‍යාපනික මධ්‍යස්ථානයකි. 1970 දශකයේ දී සිදු වූ නාගරීකරණය හේතුවෙන්, අනෙකුත් බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය කිරීම සහ ජනතාවගේ අවධානය අඩු වීම නිසා මෙම විහාරය හුදෙකලා විය. වර්තමානයේ එක් භික්ෂුවක් විහාරස්ථානයේ වාසය කරයි. මෙම විහාරස්ථානය ධර්මශාලා , ස්තූප , පුරාණ බෝධි වෘක්ෂය, ආරණ්‍ය , විහාර මන්දිරය සහ ආදී බෞද්ධ විහාරස්ථානයක අඩංගු සියලුම සිද්ධස්ථාන වලින් අංගසම්පූර්ණ විහාරයක් වේ. අවෛනික සෞන්දර්යාත්මක සුන්දර බව , සන්සුන් පරිසරය සහ මුහුදේ ක්ෂිතිජය මත කදිම දර්ශනයක් මෙම කඳුවැටියේ සිට දර්ශනය වීම නිසා මෙම ස්ථානයේ පිහිටි විහාරය සුවිශේෂී මංසලකුණක් වේ.

වර්ථමානයේදී මෙම විහාරස්ථානය ආගමික සිද්ධස්ථානයක් ලෙස ප්‍රදේශයේ වෙසෙන බෞද්ධයන්ට හට සේවයක් සිදු කරනු ලබයි. පෝය දින දේශන පැවැත්වීම, දහම් දේශන පැවැත්වීම, කඨින පූජා(වැසි සමයේ කැපවන ස්වාමින්වහන්සේලා වෙනුවෙන් සිදු කරනු ලබන පූජාවන්) වැනි විශේෂ ආගමික පූජෝත්සවයන් වැනි ආගමික වැඩසටහන් රාශියක් සිදු කරනු ලබන අතර බෞද්ධ දරුවන් වෙනුවෙන් ඉරුදින දහම් පාසල් පැවැත්වීම ද විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් ගමේ සුභසාධන ක්‍රියාකාරකම් කිහිපයක්ද ක්‍රියාත්මක කරනු ලබයි. විහාරස්ථානය ආශ්‍රිතව සිදුවන ආගමික, සංස්කෘතික සහ සමාජීය ක්‍රියාකාරකම් රාශියක් සඳහා නිවාස 50ක් පමණ සහභාගී වේ.

**දිස්ත්‍රික් කම්කරු කාර්යාලය (පහළ බෑවුම)**

කම්කරු හා කම්කරු සබඳතා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය පිහිටා ඇත්තේ අවදානමට ලක්වූ පහළ බෑවුමේය. මෙම ගොඩනැගිල්ල මහල් ගොඩනැගිල්ලක් වන අතර පළමු මහල බස්නාහිර පළාතේ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ කාර්යාලය වන අතර දෙවන මහල දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය පිහිටා ඇත. මුළු කාර්ය මණ්ඩලය තිස් දෙනෙකුගෙන් සමන්විත වන අතර මුරකරුවකු යොදවා නොමැත. ප්‍රධාන වශයෙන් ආයතනය විසින් ශ්‍රමය ආශ්‍රිත සේවා සැපයීම සිදු කරන අතර **, 30%**ක **ETF** නිදහස් කිරීම**,** මියගිය පුද්ගලයන්ගේ EPF මුදල් ලබා දීම සිදු කරනු ලබයි. මෙම සේවාවන් ලබා ගැනීම සඳහා දිනකට මිනිසුන් **100** ක් පමණ පැමිණේ. තව ද, සඳුදා සහ බදාදා යන දිනයන්හිදී කම්කරු පරීක්ෂණ සඳහා ජනතාව මෙම කාර්යාලයට පැමිනෙන අතර දිස්ත්‍රික්කයේ සිටින කම්කරුවන්ගේ සියලුම වාර්තා මෙම ස්ථානයේ තබා ඇත.

**වර්තමානයේ පවතින අවදානම් මට්ටම**

දිස්ත්‍රික් කම්කරු කාර්යාලය හා විහාරස්ථානය පිහිටන බෑවුම වර්තමානයේ ඉතා අවදානමකට හා බාදනයට ලක්ව ඇත. ජා.ගො.ප.සං.යේ විමර්ශනයට අනුව, බෑවුමේ ආතති පැළුම හා අස්ථායි කොටස් හේතුවෙන් අනාගත නාය යාමේ අවදානමක් ඇති අතර දිස්ත්‍රික් කම්කරු කාර්යාල ගොඩනැගිල්ලේ කටයුතු හා ජනතාවද පහල බෑවුමේ නිවාස කිහිපයකටද අවදානමක් ඇති කරයි .

මීට අමතරව ඉහළ බෑවුම් ප්‍රදේශයේ වැදගත් ඓතිහාසික බෞද්ධ විහාරයක් වන කුමාරිකන්ද විහාරයද ඉහළ අවදානම් බාණ්ඩය යටතේ ශ්‍රේණිගත කර ඇත. විහාරස්ථාන භූමියේ ඇති ආතති පැළුම නිසා ආගමික සිද්ධස්ථාන, වතාවන් සහ විහාර ගොඩනැගිල්ලට දැඩි අවදානමක් එල්ල වී ඇත. විහාරස්ථානයේ ව්‍යුහයන්ට හානි සිදුවීම හේතුවෙන් ඉදිරියේදී විහාරය ආගමික වතාවන් සඳහා නුසුදුසු විය හැකි අතර විහාරස්ථානයේ වැදගත් ආගමික කටයුතු සඳහා පැමිණෙන එම ප්‍රදේශයේ බැතිමතුන් කෙරෙහි බලපෑම් ඇතිවිය හැක.

තවද, කම්කරු දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල හා අවදානම් බෑවුම අතර ඇති බිම් තීරය සනීපාරක්ෂක පහසුකම් වෙත පිවිසීම සඳහා දෙපාර්තමේන්තුවේ සේවාලාභීන් විසින් සාමාන්‍යයෙන් භාවිතා කරනු ලැබේ.නාය යාම් මගින් මෙම බිම් තීරයට බාධාවන් එල්ල විය හැකි අතර, හදිසියේ නාය යාමට ලක් වුවහොත් එහි ප්‍රතිඵලයක් වශයෙන් ජීවිත හානි පවා සිදු විය හැක.

**6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑම් ඇතිවිය හැකි අවට පරිසරයේ සංවේදී ඒකකයන් පිළිබඳ කෙටි හැඳින්වීමක්.**

ඉහත පැහැදිලි කළ පරිදි, යෝජිත නායයාම් අවම කිරීමේ ස්ථානය කඳු බෑවුම් සහිත ප්‍රදේශයක පිහිටා ඇත.. නාය යාමට ලක් වූ ඉහල බෑවුම් ප්‍රදේශය විහාරස්ථ භූමියක් වන අතර, නාය යාමට ලක් වූ පහළ බෑවුම් ප්‍රදේශය දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය ප්‍රදේශය වන අතර මෙම භූමි දෙකම ඉදිකිරීම් අදියරේදී අවදානමකට ලක් වේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී බලපෑමට ලක්විය හැකි අංග සහ සේවාවන්:

i . දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට පැමිණෙන කාර්ය මණ්ඩලය හා ජනතාව
ii. ස්වාමින්වහසේලා, වන්දනාකරුවන්, බෞද්ධ විහාරයේ බැතිමතුන් සහ ආගමික ක්‍රියාකාරකම්
iii. විහාරස්ථානයේ වැදගත් ඓතිහාසික වන්දනා ගොඩනැගිලි සහ ස්මාරක
iv. අවම කිරීමේ ස්ථානයට සමීප නිවෙස්වල පදිංචි කරුවන්
v. ඉරු දින දහම් පාසලේ දරුවන්
vi. සිරිල් ද සිල්වා මාර්ගයේ මගීන් සහ පදිකයින්

**7. ව්‍යාපෘතිය යටතේ යෝජිත පිළිසකර කිරීමේ ක්‍රියාමාර්ගයන්**

යෝජිත අවම කිරීමේ කටයුතු මගින් බොහෝ දුරට අවධානයට ලක් කෙරෙනුයේ i) බෑවුමේ ජ්‍යාමිතිය වෙනස් කිරීම සහ රැඳවුම් බිත්තිය ශක්තිමත් කිරීම් මගින් බෑවුම වෙනස් කිරීම ii) මතුපිට ජලාපවහන වැඩි දියුණු කිරීම සහ iii) මතුපිට ඛාදනය පාලනය කිරීම.

**8. ව්‍යාපෘති ප්‍රදේශය හා සම්බන්ධ සමාජ, පාරිසරික බලපෑම් හා අවදානම් හඳුනා ගැනීම**

**8.1 හිතකර බලපෑම**

මෙම බෑවුමේ අවධානම් තත්ත්වය අවම කිරීම මගින් අවට ප්‍රදේශයට ඇතිවන හිතකර බලපෑම පහත පරිදි වේ.

බෑවුමේ පවතින අවධානම සහ වත්මන් උපද්‍රව තත්වයන් හේතුවෙන් දිස්ත්‍රික් කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලයට සහ ප්‍රදේශයේ බැතිමතුන් හට මානසික පීඩනයන් හා දුෂ්කරතාවයන් නිර්මාණය වී තිබේ. අවම කිරීමේ කටයුතු ඔවුන්ගේ මානසික පීඩනය ලිහිල් කරනු ඇත. එමෙන්ම විහාරස්ථානය සුරක්ෂිත ස්ථානයක් වීමෙන් බැතිමතුන්ට ආරක්ෂිත පරිසරයක් තුල ආගමික වතාවන් වල යෙදීමට හැකි වනු ඇත.

කම්කරු දෙපාර්තමේන්තුවේ දැනට තාවකාලිකව ස්ථානගත කර ඇති කාර්යාල අංශයන් නැවත එහි මුල් ස්ථානය වෙත ආපසු ගෙන යා හැකි අතර සුරක්ෂිත වටපිටාවක් තුල සේවය කළ හැකිය. යෝජිත ව්‍යුහාත්මක අවම කිරීමේ කටයුතු මගින් බෑවුමේ ස්ථාවරත්වය වැඩි කිරීමෙන් කම්කරු කාර්යාල පරිශ්‍රයේ කාර්ය මණ්ඩලයේ සහ සේවා ලාභීන්ගේ ආරක්ෂාව සැලකිය යුතු ලෙස වැඩි කරනු ඇත.

**8.2 අහිතකර බලපෑම**

අවම කිරීමේ කටයුතු සාමාන්‍යයෙන් බෑවුම අස්ථාවර වීමෙන් අවදානමට ලක් වූ බෑවුම් කොටසින් දැනටමත් බාධා ඇති ප්‍රදේශයට පමණක් සීමා වී ඇත. එමනිසා, අහිතකර බලපෑම් ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන අදියරට සහ එම ප්‍රදේශයට පමණක් සීමා වේ.

**8.2.1 ඉඩම් වලට හා ඉදිරි සංවර්ධන කටයුතු සඳහා පිවිසුම් මාර්ග අවහිර වීම**

ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා සැලසුම් කර ඇති භූමිය විහාරස්ථානයට හා කම්කරු දෙපාර්තමේන්තුවට අයත් වේ. මෙම ව්‍යාපෘතිය මගින් හිමිකරුට විහාර භූමියේ අයිතිය අහිමි නොවන අතර, ගොඩනැගිලි ඉවත් කිරීමක් අවශ්‍ය නොවේ.

**8.2.2 ශාක හා සත්වයින්ට සිදුවිය හැකි පාරසරික හා ජීව විද්‍යාත්මක බලපෑම**

අධ්‍යානය ප්‍රදේශය තුළ සැලකිය යුතු ලෙස පාරිසරික හෝ ජෛව විද්‍යාත්මක වාසභූමි නොමැති හෙයින් , ඒවාට කිසිදු බලපෑමක් නොමැත.

**8.2.3 ප්‍රදේශයේ ජලවහන රටාවට සිදුවිය හැකි බලපෑම**

ප්‍රදේශයේ ජලාපවහන රටාවකට වෙනසක් සිදු නොවේ.

**8.2.4 පාංශු ඛාදනයේ බලපෑම සහ ගංගා පතුලේ සිදුවන වෙනස්වීම**

යෝජිත අවම කිරීමේ කටයුතු බොහෝ දුරට ඉහළ බෑවුම් ප්‍රදේශය තුල සිදු කිරිමට අවදානය යොමු කෙරේ. බෑවුමේ හැඩය වෙනස් කිරීම මගින් විශේෂයෙන් වැසි සමයේදී ඛාදනයට ලක් වීමේ අවදානම වැඩි විය හැකි අතර කැණීම් මගින් විශාල සුන්බුන් අතිරික්තයක් ජනනය වේ. එබැවින් මෙම ස්ථානයේ බෑවුම ඛාදනයට ලක් වීමේ අවදානමක් ඇති වේ.

**8.2.5 ඉදිකිරීම් කටයුතු නිසා සිදුවන ජල දූෂණය මගින් ඇතිවිය හැකි බලපෑම**

මෙම ස්ථානය ආශ්‍රිතව ඇළ වේලි නොමැති බැවින් ජල දූෂණ බලපෑම වැදගත් නොවේ.

**8.2.6 ඉදිකිරීම් කාලසීමාවේ දී අක්‍රමවත් (එලිමහන් ස්ථාන වල) වැසිකිලි භාවිතය නිසා ජලයට අපද්‍රව්‍ය එකතු වීමට ඇති ඇති හැකියාව**

ව්‍යාපෘති ස්ථානය ඉදිකිරීම් සහිත ප්‍රදේශයක පිහිටා ඇති බැවින් එළිමහන් ස්ථාන වල වැසිකිලි භාවිතය අවම වේ.

**8.2.7 පහල ගංගා ප්‍රදේශයේ ජලය භාවිත කරන්නන්ට සිදුවන බලපෑම**

ව්‍යාපෘති ස්ථානයට ආසන්නයේ දිය ඇල්ලක් හෝ දිය උල්පත් නොමැත. එබැවින් ගංගා ජලය සඳහා කිසිදු බලපෑමක් නැත.

**8.2.8 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළු**

ඉදි කිරීම් කාලය තුළදී ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ නිසි යාන්ත්‍රණයක් නොතිබුවහොත් පරිසරය දූෂනය වීමෙන් බලපෑම් ඇති විය හැකිය. ව්‍යාපෘති ස්ථානය පිහිටා ඇත්තේ මාර්ගයට ආසන්නයේ වන අතර රජයේ කාර්යාලය හා විහාරස්ථානය නිසි ලෙස ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය නොකිරීම නිසා මහජනයාට අප්‍රසන්න භාවයක් හා , දෘශ්‍ය දූෂණය ඇති විය හැකිය. ඉදිකිරීම් කාලය තුළ නිසි ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ යාන්ත්‍රණයක් භාවිතා නොකළ හොත් මෙම බලපෑම වැදගත් වේ.

**8.2.9 වායු දූෂණය හා සම්බන්ධ ගැටළු**

වායු දූෂණයට දායක වන ඉදිකිරීම් ක්‍රියාකාරකම් වනුයේ: ව්‍යාපෘති භූමිය සැකසීම , ඩීසල් එන්ජින් යොදා කැනීම් කටයුතු සිදු කිරීම, ගිනි තැබීම සහ ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම, ඉදිකිරීම් අතරතුර භාවිත කරන සහ ඉවතලන විෂ සහිත ද්‍රව්‍ය (පිපිරුම් රසායන ද්‍රව්‍ය) භාවිත කිරීම්, කොන්ක්‍රීට්, සිමෙන්ති, ලී, ගල්, සහ සිලිකා වැනි ද්‍රව්‍ය වලින් ද අධික ලෙද වාදු දූෂනයට හේතු වන දූවිලි හා වායු දූෂණ කාරක ඇති කරයි. මෙමගින් කම්කරු කාර්යාලයේ කාර්ය මණ්ඩලය හා සේවා ලාභීන් කෙරෙහි වායු දූෂණයෙන් බලපෑම් ඇති විය හැකිය. ව්‍යාපෘති ස්ථානය ආසන්නයේ කම්කරු කාර්යාලය පිහිටා ඇති බැවින් එයින් සේවය ලබා ගැනීමට පැමිණෙන සැලකිය යුතු ජන සංඛ්‍යාවක් ඍජුවම ඉහල වායු දූෂණයට නිරාවරණය වීමේ අවදානමක් පවතී.

**8.2.10 ඉදිකිරීම් වලදී ඇතිවන ශබ්දය දූෂණය, කම්පන, පිපිරීම් වැනි තත්ත්වයන් හේතුවෙන් ගොඩනැගිලි වලට හා යටිතල පහසුකම් වලට සිදුවිය හැකි හානි**

ඉදිකිරීම් උපකරණ වලින් ශබ්ද සහ කම්පන ඇති වීම සාමාන්‍ය තත්ත්වයකි. විහාරස්ථානය හා දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ආසන්නයේ ඉදිකිරීම් කටයුතු සිදුවන බැවින් අධික ශබ්දයෙන් වන බලපෑම පිළිබඳව අවධානය යොමුකල යුතුය. යන්ත්‍රෝපකරණවලින් ජනනය වන ශබ්දය මගින් විහාරස්ථානයේ ආගමික කටයුතු වලට සහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සේවාවන් වලට බාධා පැමිණිය හැක. එබැවින් මෙම ඉදිකිරීම් භූමියේ යන්ත්‍රෝපකරණ වලින් නිකුත් වන අධික ශබ්දය කෙරෙහි අවධානය යොමුකල යුතුය.

බර යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක කිරීමෙන් ඇතිවන කම්පනය විහාරස්ථානයේ සහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ ගොඩනැගිලිවලට බලපෑම් ඇතිකරයි. එහි ප්‍රතිඵලයක් ලෙස බිත්ති පුපුරායාම හා කඩා වැටීම වැනි ව්‍යුහාත්මක බලපෑම් සිදුවිය හැක. එබැවින් මෙම ව්‍යාපෘති ස්ථානීයයේ ඉදිකිරීම් කටයුතු වලින් සිදුවන කම්පන කම්පන බලපෑම් පිළිබඳව විශේෂ අවධානය යොමුකලයුතු වේ.

**8.2.11 වැඩබිමේ සේවකයින් හා අවට ප්‍රදේශවාසීන් අතර ඇතිවිය හැකි නොසන්සුන් තත්ත්වයන්**

ව්‍යාපෘති ස්ථානයේ සේවකයන් සහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ කාර්ය මණ්ඩලය, විහාරස්ථානයේ බැතිමතුන් සහ අවට ජීවත් වන පදිංචිකරුවන් අතර ආරවුල් ඇති විය හැක. රියදුරන් සහ ව්‍යාපෘති ස්ථානයේ ශ්‍රම බලකාය අතර වාහන නැවැත්වීමේ ඉඩකඩ සම්බන්ධ ගැටළු ඇතිවිය හැකිය.

**8.2.12 සේවක නේවාසික කඳවුරු සහ අනෙකුත් ස්ථානීය අවශ්‍යතාවයන්**

කම්කරුවන්ගේ නේවාසික ස්ථාන වියාපෘති ස්ථානයට සමීපව පිහිටුවා ඇත ඇතැම්විට කොන්ත්‍රාත්කරු ආසන්නයේ ඇති නිවසක් කුලී පදනම මත ලබා ගැනීමට පෙළඹෙනු ඇත. තාවකාලික නේවාසික ස්ථාන සාමාන්‍ය ජනතාව වාසය කරන ගම්මානය තුලින් සපයා ගැනීමට යොමුවනු ඇත. විධිමත් කඳවුරු කළමානකරණ ක්‍රමවේද අනුගමනය නොකලහොත් කම්කරු ගැටළු, පොදු පහසුකම් භුවමාරු කරගැනීමේදී නොසන්සුන් තත්ත්වයන්, ඔවුන් අතර ඇතැම් සමාජ ගැටළු හා අපද්‍රව්‍ය කළමානාකරණය පිළිබඳ ගැටළු ඇතිවීමට ඇති ඉඩකඩ ඉහලය.
තාවකාලික නේවාසික ස්ථාන ව්‍යාපෘති භූමියට ඉතා ආසන්නයේ ඉදිකරණු ලැබුවහොත් ඝන අපද්‍රව්‍ය, අක්‍රමවත් මල අපවහන පද්ධති කළමානකරණය පිළිබඳව ගැටළු ඇති විය හැකිය. එබැවින් එවැනි තත්ත්වයන් පිළිබඳව අවධානය යොමුකල යුතුය.

.

**8.2.13 ඉදිකිරීම් අතරතුර ප්‍රදේශවාසීන් වැඩබිමට පිවිසීම හේතුවෙන් ඔවුන්ට මුහුන දීමට සිදුවිය හැකි අවධානම් තත්ත්වයන්**

හෑරීමට, පොලොව විදීමට සහ කැණීමට භවිතා වන අධික අවදානම අවදානමක් සහිත යන්ත්‍රෝපකරණ මෙම වැඩ බිම තුල තිබිය හැක.එම නිසා මෙම වටපිටාව තුල පුහුණු ශ්‍රම බලකායක් සුරක්ෂිතව කටයුතු කරනු ඇත. අනවසර පුද්ගලයින් වැඩ බිමට පිවිසෙන්නේ නම්, බර යන්ත්‍රෝපකරණ මගින් හදිසි අනතුරුවලට ලක්වීමේ අවදානම තිබිය හැකිය.

**8.2.14 පුපුරණ ද්‍රව්‍ය සහ එවැනි වෙනත් අනතුරුදායක ද්‍රව්‍ය හේතුවෙන් ඇතිවිය හැකි අවධානම් තත්ත්වයන්**

බැවුමෙහි සුන්බුන් ගලන මාර්ගයේ ගල් තැන්පත් වීම නිසා බාධක රැසක් ඇති වී ඇත. මෙම ගල් පිපිරීමට පුපුරණ ද්‍රව්‍ය යොදාගත හැකි වන අතර එම ද්‍රව්‍ය අනාරක්ෂිත ලෙස භාවිත කිරීම හේතුවෙන් අවදානමක් මතු විය හැක. මෙම මෙහෙයුම් අවදානම් බැවුම් මත සිදු කළ යුතු බැවින් අවිධිමත් පුපුරණ ද්‍රව්‍ය භාවිතය හා පාෂාණ කොටස් වලින් අනතුරු සිදු වීමේ අවදානම ඉතා වැදගත් වේ.

**8.2.15 ඉදිකිරීම් කටයුතු හා මහජන ආරක්ෂාව :මාර්ගය භාවිතා කරන මගීන්ට ඇති අවධානම**

ඉදිකිරීම් සිදු කරනු ලබන අවධියේදී ඉදිකිරීම් කටයුතු සීමිත ඉඩකඩක් තුළ කාර්යබහුල රජයේ ආයතනයනකට යාබදව සිදු කරනු ලබන බැවින් මෙම අවකාශය තුල නිතරම යන්ත්‍රෝපකරණ , බුල්ඩෝසර්

, ට්‍රක් රථ ආදිය ගමන් කිරීමෙන් බාධා වීම් ඇති වේ . මෙම යන්ත්‍රෝපකරණ සහ ඉදිකිරීම් වාහන මගින් මහජනතාව හා කාර්ය මණ්ඩලය කෙරෙහි අවදානමක් මතු විය හැකිය.

**8.2.16 ව්‍යාපෘති කාල සීමාව තුල සේවක ආරක්ෂාව**

වාහන හා ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ මගින් අනතුරට ලක් වීමේ අවදානම ඕනෑම ඉදිකිරීම් ස්ථානයකට පොදු වේ. කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කටයුතු සඳහා බාලවයස්කාර කම්කරුවන් (ළමයින්) යෙදවීමෙන්, ඔවිනට බරපතල අනතුරු හා තුවාල සිදුවීමේ අවදානමක් ඇත.

**9. මහජනතාව, අනෙකුත් පාර්ශවකරුවන් වෙනුවෙන් පවත්වා ඇති හෝ පැවැත්වීමට නියමිත උපදේශන සේවාවන්.**

ව්‍යාපෘති ස්ථානය නිරීක්ෂණය කරන අතරතුරදී කුමරිකන්ද විහාරයේ විහාරාධිපති නායක ස්වාමීන්වහන්සේ වන පූජ්‍ය හක්මන තිලකසිරි ස්වාමීන් වහන්සේ සහ දායක සංගමයේ සභාපති; එස්. මද්දුමබණ්ඩාර මහත්මිය යන අයගෙන් කරුණු පිළිබඳව විමසීමක් සිදු කරන ලදී . ඔවුන් පවසන අන්දමට මෙම අවදානම් තත්වය නිසා විහාරය භූමිය ඛාදනයට ලක්වීමේ බලපෑමක් ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් කඳු මුදුනේ ඉඩම් ප්‍රමාණය අඩුවීම සිදු වී ඇත . බෑවුමේ අස්ථාවරත්වය නිසා විහාර පරිශ්‍රයේ රැඳී සිටීම අනාරක්ෂිත වේ.

.බස්නාහිර පලාත් කලාප අංක **2** හි නියෝජ්‍ය කම්කරු කොමසාරිස් වන R.W.M. පොඩිනිලමේ මහතාගෙන් කරුණු රැස් කල අතර ඔහු පවසන පරිදි නවාතැන් පහසුකම් සඳහා කම්කරු කාර්යාල පරිශ්‍රයේ ඉඩ ලබා නොදී ඇත . කොන්ත්‍රාත්කරු විසින් විදුලි ගාස්තු සහ ජලය පිරිවැය සඳහා පිරිවැය වන්දි ගෙවිය යුතු වන අතර ශ්‍රම බලකායේ පිරිසිදු කිරීම් කටයුතු සඳහා කම්කරු කාර්යාලයේ සනීපාරක්ෂක පහසුකම් භාවිතා කළ හැකිය. සේවක බලකායේ සහ කම්කරු කාර්යාලයේ කාර්යමණ්ඩලය අතර රථ වාහන නැවැත්වීම සම්බන්ධයෙන් ආරවුලක් ඇති බවටද ඔහු අවධාරණය කළේය. තවද බෑවුමේ නාය යාම හේතු කොට ගෙන වරින් වර කාණු පද්ධතිය අවහිර වීමෙන් බාධා ඇති වන බව හා ගස් කඩා වැටීම සිදු විය හැකි බැවින් බියට පත්ව සිටී.

ව්‍යාපෘතියේ වත්මන් මට්ටමේ අවධානම, අපේක්ෂිත අවම කිරීම, අරමුදල් සැපයීමේ යාන්ත්‍රණය සහ ව්‍යාපෘති ස්ථානයට පිවිසීමට ඉඩම් භාවිතා කිරීම සඳහා අවශ්‍ය ඉදිකිරීම්, යන්ත්‍රෝපකරණ ගෙනයාම පිළිබඳව ස්වාමින්වහන්සේ , නියෝජ්‍ය කම්කරු කොමසාරිස් සහ බැතිමතුන් දැනුවත් කරන ලදී.තවදුරටත්, ව්‍යාපෘතියේ ප්‍රතිලාභ, සෘණාත්මක සහ ධනාත්මක පාරිසරික හා සමාජීය බලපෑම් යන දෙකම ඔවුන්ට පැහැදිලි කරන ලදි.

මෙම ව්‍යාපෘතියට කරගෙන යාමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා සියලු පාර්ශ්වයන් කැමැත්තක් දැක්වූ අතර ඉදිකිරීම් කටයුතු සඳහා විහාරස්ථාන භූමියේ සහ දිස්ත්‍රික් කම්කරු කාර්යාල පරිශ්‍රයේ පහසුකම් සහ ඉඩම් ලබා දීමට එකඟ විය.

**9.1 අදාල පාර්ෂවකරුවන් සමග පැවති උපදේශන සේවාවන් වලදී ඇති වූ එකඟතාවයන් හා නිර්දේශයන් (යොමුව: ඇමුණුම I - උපදේශන සේවා)**

**10. විශේෂිත පාරිසරික හා සමාජීය බලපෑම්: ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ විශේෂිත ක්‍රියාමාර්ග හෝ මැදිහත්වීම් අවශ්‍ය වන සමාජ, පාරිසරික බලපෑම් හෝ අවදානම් ඇතිවන අංශයන්**

මහජනතාවට විවෘතව පිහිටි ස්ථානයක ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන අතර ව්‍යාපෘති ස්ථානයට පහල බෑවුමෙන් (කම්කරු දෙපාර්තමේන්තුවේ පරිශ්‍රය හරහා ) හෝ පන්සල භූමියෙන් (ඉහල බෑවුමේ )පිවිසිය හැකිය. ඉදිකිරීම් ශ්‍රම බලකාය හා යන්ත්‍රෝපකරණ සඳහා මෙම පොදු ප්‍රවේශ මාර්ගය භාවිතා කිරීමට සිදු වේ. තවදුරටත්, සීමා සහිත පරිසරයක් තුළ මෙහෙයුම් කටයුතු සිදුකිරීමට සිදුවනු ඇත. මෙම තත්ත්වය යටතේ ඉදිකිරීම් ව්‍යාපෘතිය තුළදී, සමාජීය අවදානමක්, ආරක්ෂිත ගැටළු සහ ප්‍රවේශය, වාහන නැවැත්වීම, ජල පහසුකම්, විදුලිය වැනි පොදු පහසුකම් භාවිතා කිරීම සඳහා ප්‍රායෝගික ගැටළු මතු වේ.

**10.1 ජලය හෝ තෙත් බිම් සඳහා වන බලපෑම් (ඇල මාර්ග වල අපද්‍රව්‍ය එකතු වීමෙන් සිදුවන ගැටළු). නායයාම් ස්ථානයේ ඉදිකිරීම / පිළිසකර කිරීම තුළින් දිගුකාලීන බලපෑම් සහ වියහැකි බලපෑම සහ අවදානම් තත්ත්වය**

මෙම ස්ථානයට ආසන්නව ජල මාර්ග නොමැති බැවින්, එය නොගිනිය හැකි තරම් වනු ඇත.

**10.2 ඛාදන ක්‍රියාවලිය ආශ්‍රිත බලපෑම් හා ගංඟා පතුලේ සිදුවන වෙනස්වීම්**

වැසි සහිත කාලගුණය තුළ අපේක්ෂිත වැඩ කටයුතු සිදුකළහොත් ඉහල බෑවුම් ප්‍රදේශය මත සිදුවන ඛාදන බලපෑම් ඉහළ වන අතර තෙත් කාලවලදී ඉහළ තාවකාලික ඝන ද්‍රව්‍ය සහිත ජලය ජල කාණු වලට ඇතුල් විය හැක.

**10.3 ප්‍රවාහන හා යටිතල පහසුකම් වලට සිදුවන බලපෑම (විශේෂයෙන් තාවකාලිකව පිවිසුම් මාර්ග හා දුම්රිය මාර්ග අහිමි වීම, වාහන තදබදය)**

ව්‍යාපෘති ස්ථානය අභ්‍යන්තර පරිසරයක් තුල පිහිටීම නිසා සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් මාර්ගය වසා දැමීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත් පාසැල් දෙකක් ,රාජ්‍ය ආයතන සහ කෝවිලක් එම ස්ථානයට ආසන්නව පිහිටි නිසා යන්ත්‍රෝපකරණ එහා මෙහා යාම, ද්‍රව්‍ය ප්‍රවාහනය මගින් මාර්ගයේ පදිකයින් හා මගී ජනතාව වෙත බාධා ඇති කරනු ඇත .

**10.4 පොදු සේවා සැපයීමේදී පහල ප්‍රදේශයට සිදුවන බලපෑම (ජල සැපයුම, අපද්‍රව්‍ය ඉවත් කිරීම, විදුලිය සැපයීම, ආදිය)**

පහල ප්‍රදේශයේ සේවා සැපයීම කෙරෙහි කිසිදු බලපෑමක් නැත.

**10.5 සත්ව හා ශාක විශේෂ වලට සිදුවන පාරිසරික, ජෛව විද්‍යාත්මක බලපෑම්**

අධ්‍යයනය ප්‍රදේශය තුළ සැලකිය යුතු පාරිසරික හෝ ජෛව විද්‍යාත්මක වාසභූමි නොමැති බැවින් ඒවාට කිසිදු බලපෑමක් නැත.

**10.6 ප්‍රදේශයේ ජලවහන රටාව මත ඇති කරන බලපෑම**

ව්‍යාපෘති ප්‍රදේශය සීමා කර ඇති බැවින් සැලකිය යුතු නොවේ.

**10.7 ඉදිකිරීම් කාලසීමාවේ දී අක්‍රමවත් (එළිමහන් ස්ථාන වල) වැසිකිළි භාවිතය නිසා ජලයට අපද්‍රව්‍ය එකතු වීමට ඇති ඇති හැකියාව**

ආසන්නයේ ජල මාර්ග නොමැති වීම නිසා ශ්‍රම බලකාය මගින් අක්‍රමවත් (එළිමහන් ස්ථාන වල) වැසිකිළි භාවිතය නිසා ජලයට මළද්‍රව්‍ය එකතු වීමෙන් ජලය මගින් ලෙඩරෝග බෝවීම අපේක්ෂා නොකෙරේ.

**10.8. ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ජලය අපවිත්‍ර වීම**

ඝන අපද්‍රව්‍ය මගින් පස දූෂණය විය හැකි අතර, ඉදිකිරීම් කාලය තුළ නිසි ලෙස බැහැර කිරීමේ යාන්ත්‍රණයක් නොපැවතුනහොත් විවිධ පාරිසරික බලපෑම් ඇති වේ. එම නිසා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පරිසර බලපෑම් ඉතා වැදගත් වේ.

**10.9 ඉදිකිරීම් භූමියට ආසන්නව වාසය කරන ඉහල හා මධ්‍ය වශයෙන් අතිවිය හැකි අවධානම් තත්ත්වයන් (නාය ඉහල ප්‍රදේශය, පහල ප්‍රදේශය හා පහල ගංඟා නිම්න ප්‍රදේශය)**

ඉදිකිරීම් කටයුතු නිසා මහජන ආරක්ෂාව, ශබ්දය සහ කම්පන බලපෑම්,කම්කරු කාර්යාලයේ ගොඩනැගිලිවල සහ පන්සලේ ගොඩනැගිලි වල පැළුම් ඇති වීමේ ඉහළ අවධානමක් පවතී.

**10.10 නැවත ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශය තුල පිහිටා ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙක් ස්ථාන**

මෙම ස්ථානය සඳහා අවශ්‍ය නොවේ.

**10.11 නාය ස්ථානයට අසලින්ම පිහිටි ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙක් ස්ථාන**

ව්‍යාපෘති ස්ථානයට පිවිසීම සඳහා රථගාල සහ පොදු පහසුකම් ආදිය භාවිතා කිරීම දූවිලි, ශබ්දය හා කම්පනය නිසා කම්කරු කාර්යාලයේ කාර්යයන් අර්ධ වශයෙන් පීඩාවට පත් කරනු ඇත.

**10.12 වැඩබිම තුලට සාමාන්‍ය පුද්ගලයින් ඇතුල් වීමේ හෝ හරහා ගමන් කිරීමේ අවශ්‍යතාවය.**

ව්‍යාපෘතිය මගින් බලපෑම් ඇති වන ප්‍රදේශය මහජනතාව (විහාර හා කම්කරු කාර්යාල) සමඟ ස්ථානගත වී ඇති අතර එබැවින් ක්‍රියාකාරී යන්ත්‍රෝපකරණ, වාහන, විදුලිය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතා වන බැවින් හානි සිදුවිය හැකිය.

**10.13 සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ ගැටළු - කොන්ත්‍රාත්කරුවන් සඳහා සම්මත ගිවිසුම් ඉක්මවා යන විශේෂිත H & S (සෞඛ්‍ය හා සුරක්ෂිතතා) ක්‍රමවේදයන්.**

ශ්‍රම බලකාය පහත දැක්වෙන අධි අවදානම් අවස්ථාවන්ට නිරාවරණය විය හැක.

i. විවිධාකාර ඉදිකිරීම් කටයුතු සඳහා බැවුම නිරන්තරවම ඉහල පහල ගමන් කිරීමට සිදුවීම හේතුවෙන් අස්ථාවර බෑවුම් මත වැඩ කිරණ කම්කරුවන්ට අවදානම් තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවේ.
ii. වාහන හා ඉදිකිරීම් යන්ත්‍රෝපකරණවලින් ඇතිවන අවදානම
iii. **නායයෑම් ආපදා අවදානම**

**10.15 ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය යොදා ගැනීම**

වැඩ කරන තත්ත්වයන් සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව චක්‍රලේකයේ 2003.3 වගන්තියට අනුව ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය යොදා ගැනීම සවිස්තරාත්මකව දක්වා ඇත.

**11. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන අනුමැතීන් සහ විරෝධතා නොමැති බව**

11.1 **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

i. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමැතිය

දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කළ යුතු අතර, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට පළාතේ මහ ඇමති වරයා හා පාර්ශ්වකරුවන්ගේ ආයතන ද සහභාගී වනු ඇත. PMU නිලධාරියා මෙම ව්‍යාපෘතිය ඉදිරිපත් කරනු ලබන අතර, ව්‍යාපෘති තොරතුරු සහ පාරිසරික හා සමාජයීය විවිධ ගැටලු නිරාවරණය කිරීම හා ගැටළු සාකච්ඡා කරනු ඇත. මෙම රැස්වීමෙහි නිර්දේශය ESMP ක්‍රියාත්මක කිරීම සඳහා සලකා බලනු ඇත.

ii. සැලසුම් කමිටුවේ අනුමැතිය

කළුතර නගර සභාවෙහි සැලසුම් කමිටු විසින් මෙම ව්‍යාපෘතියට අනුමැතිය ලබා ගත යුතුය.

**11.2 අදාල ස්ථානයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන අනුමැතිය.**

i. ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ විහාරාධිපති හිමියන්ගේ අනුමැතිය .
ii. කළුතර දිස්ත්‍රික් කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමාගේ අනුමැතිය.

11.3 **මධ්‍යයම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු අනුමැතිය.**

මධ්‍යයම පරිසර අධිකාරිය (CEA) අනුව, මෙම ප්‍රදේශය සංවේදී කලාපයක් නොවන අතර ඒ අනුව CEA අනුමැතිය අවශ්‍ය නොවේ. වනාන්තර වෙන් කිරීම සහ වනජීවී වාසස්ථාන නොමැති හෙයින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අනුමත කිරීම අවශ්‍ය නොවේ.

**11.4 වෙනත් අනුමැතීන්**

i. භූමි, පාෂාණ හා ඛනිජමය සුන්බුන් ප්‍රවාහනය හා බැහැර කිරීම සඳහා ප්‍රාදේශීය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයේ අනුමැතිය ලබා ගත යුතුය.
ii. ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා අනුමැතිය - භූ විද්‍යා හා පතල් කාර්යංශයේ අනුමැතිය (අවශ්‍ය වන්නේ නම් පමණි).
iii. අපද්‍රව්‍ය හා ශාක කොටස් බැහැර කිරීම සඳහා වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.
iv. පාෂාණ පිපිරවීම සඳහා අවශ්‍ය ස්ථාන සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ දිස්ත්‍රික් කාර්යාලයෙන් ප්‍රාදේශීය ලේකම් හරහා අනුමැතිය ලබා ගත යුතුය.
v. ඉදිකිරීම් සඳහා අවශ්‍ය විදුලි බලය සඳහා ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයෙන් අනුමත කිරීම අවශ්‍ය වේ.

### 11.5 පුද්ගලික ඉඩම් හිමිකරුවන්ගෙන් අනුමැතිය ගැනීම / විරෝධතා නොමැති බව/ නීත්‍යානුකූලව බැඳුණු එකඟතාවයන්.

ව්‍යුහයන් ඉවත් කිරීමට, භූමියට පිවිසීමට, ඉදිකිරීම් වැඩ සහ දිගුකාලීන නඩත්තු කටයුතු වල නිරත වීමට කිසිදු බාධාවක් නොකරන බවට විහාරස්ථානයේ විහාරාධිපති හිමියන්ගේ, කළුතර දිස්ත්‍රික් කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමාගේ සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය අතර නීත්‍යානුකූලව බැඳී ඇති ගිවිසුමක් අත්සන් කිරීම. අනුමැතිය ලබා ගැනීම සඳහා නියමිත අනුමාන කාල සටහන 1 වගුවේ දක්වා ඇත.

වගුව 1: අනුමැතීන් ලබා ගැනීම සඳහා නියමිත කාල නියමය

| අනුමත කිරීම | මාසය 1 | | | | මාසය 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සතිය 1 | සතිය 2 | සතිය 3 | සතිය 4 | සතිය 1 | සතිය 2 | සතිය 3 | සතිය 4 |
| ***ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අනුමැතිය***<br>අයදුම්පත් ඉදිරිපත් කිරීම<br>ව්‍යාපෘති සාකච්ඡාව<br>අදහස්වලට ප්‍රතිචාර දැක්වීම<br>අනුමත කිරීම | | | | | | | | |
| ***සැලසුම් කමිටුවේ අනුමැතිය***<br>අයදුම්පත් ඉදිරිපත් කිරීම<br>ව්‍යාපෘති සාකච්ඡාව<br>අදහස්වලට ප්‍රතිචාර දැක්වීම<br>අනුමත කිරීම | | | | | | | | |
| ***වෙනත් අනුමැතීන්***<br>භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අනුමැතිය<br>ආරක්ෂක අමාත්‍යාංශයේ (අවශ්‍යතාවය අනුව) | | | | | | | | |
| විහාරස්ථානයේ විහාරාධිපති හිමියන්ගේ, කළුතර දිස්ත්‍රික් කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමාගේ අනුමැතිය | | | | | | | | |

## 12. පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්ම (ESMP)

විශේෂයෙන් අංශ 8 සහ 10 හි හඳුනාගත හැකි බලපෑම් හා අවදානම් කළමනාකරණය කිරීම සහ අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග. මෙය ESMP හි විශේෂිත නිර්දේශ හා අවශ්‍යතාවන් තුල ඇතුලත් වනු ඇත.

### 12.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

ව්‍යාපෘති පාදක කරගත් නැවත පදිංචි කිරීමක් නොමැති බැවින් මෙම ව්‍යාපෘති ප්‍රදේශය සඳහා අදාළ නොවේ.

## 12.2 ජනතාව ඉවත් කිරීම

ඉදි කිරීමේ අවධියේදී නාය යාමේ ක්‍රියාවලිය සක්‍රීය විය හැකි අතරම,අවම කිරීමේ කටයුතු මගින් බෑවුම අස්ථාවර වීමේ අවදානම උග්‍ර වීම කෙරෙහි ද දැඩි බලපෑමක් ඇතිකරනු ලබයි, එබැවින් ව්‍යාපෘති ක්‍රියාවලින් සමග අවදානම් තත්ත්වයන් එකිනෙකට බැදී ඇති බව සැලකිල්ලට ගැනීම තර්කානුකූල වේ . එබැවින් තාවකාලික ඉවත් කිරීමේ පද්ධතියක් මෙම ස්ථානයට දැඩි ලෙස අනුමත කරනු ලැබේ.

එසේම, පාරිසරික ආරක්ෂණ ඒකකයේ පාරිසරික, සමාජ හා සෞඛ්‍ය හා සුරැකීමේ ඒකකය විසින් අනතුරු ඇඟවීමේ පද්ධතීන් ක්‍රියාත්මක කිරීම හා මෙම ස්ථානයේ පුද්ගලයින් ඉවත් කිරීම සහතික කිරීමට විශේෂ අවධානය යොමු කළ යුතුය. තවද, පාෂාණ කොටස් වැටීමෙන්, සුන්බුන් ගලායාමෙන් ප්‍රජාවට වන අවදානම අවම වන පරිදි ගත හැකි සෑම අවදානම් අවම කිරීමේ කටයුතු සිදු කල යුතුය.

## 12.3 හානියට පත් භෞතික ව්‍යුහයන් , යටිතල පහසුකම් ඉවත් කිරීම සඳහා ක්‍රියා පටිපාටිය

මෙම අවදානම මෙම ස්ථානය සඳහා අදාළ නොවේ

## 12.4 ව්‍යාපෘති කටයුතු හේතුවෙන් දේපල අහිමි - භාවිතයන් -හාණි වීම් සඳහා වන වන්දි ඉල්ලාසිටීම්.

ව්‍යාපෘති කටයුතු වලදි, වාහන යන්ත්‍රසූත්‍ර එහා මෙහා ගමන් කිරීමෙන් හා කැණීම් කටයුතුවලදී පාරවල්, ජලසැපයුම් මාර්ග සහ අනෙකුත් ව්‍යුහයන්ට සිදුවන හානි අදාළ විය හැකිය. හානි ඇගයීමේදී බලපෑමට ලක් වූ පාර්ශවයන්ට වන්දි ගෙවීමට සුදුසු වන්දි යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.

## 12.5 පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කල යුතුය

පදිංචිකරුවන් සහ ශ්‍රම බලකාය සඳහා නායයාමේ අවදානම පිළිබඳ විශේෂ අධ්‍යාපනයක් හා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කල යුතු අතර කොන්ත්‍රාත්කරුගේ ශ්‍රම බලකායට සඳහා ඉදිකිරීම් අදියර තුළදී සෞඛ්‍ය හා ආරක්ෂණ අවශ්‍යතා පිළිබඳව විශේෂ අධ්‍යාපනයක්ලබා දිය යුතුය. ඉදිකිරීම් අදියර තුළ ඇති විය හැකි අවදානම , කෙටිකාලීන පූර්ව අනතුරු ඇඟවීම් (ඉවත් කිරීම්) සහ ඉදිකිරීම හා ඉඩම් පරිහරණය සම්බන්ධ මිනුම් පිළිබඳව ප්‍රජාව විශේෂයෙන් දැනුවත් කල යුතුය .

## 12.6 සැලසුම් මත පදනම් වූ පාරිසරික /සමාජ කළමනාකරණ ක්‍රවේදයන් සලකා බැලීම.

පාරිසරික හා සමාජ සැලසුම් අනුව මෙම ස්ථානය සඳහා පාරිසරික හා සමාජයීය අදාලත්වය සැලකිල්ලට ගනී.

වගුව 2 : සැලසුම් අදියරේදී පාරිසරික හා සමාජීය කරුණු සලකා බැලීම.

| අංගය | මෙම ව්‍යාපෘති ප්‍රදේශය සඳහා සලකා බැලීම සඳහා නිර්දේශිත මට්ටම |
|---|---|
| i. **ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ සම්පත් ප්‍රශස්ත ලෙස සැලසුම් කරණය**<br>ශාක විශේෂයන් ඉවත් කිරීම අවම කිරීම සඳහා වන ව්‍යාපෘති විශේෂිත සැලසුම් සැලකිල්ලට ගත යුතුය. වැදගත් ශාක විශේෂ වෘක්ෂලතා අවරණය සමග බැඳී ඇත්නම්, ශාක සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය | අඩු |
| ii. **වාසස්ථාන සම්බන්ධතා සහ සත්ත්ව මංපෙත්**<br>ස්ථිර ඉදිකිරීම් සඳහා හෝ ව්‍යාපෘතියට පිවිසීමට හෝ ගැඹුරු කානු පද්ධති ආදිය සඳහා හෝ විශාල වශයෙන් වනාන්තර කොටස් ඉවත් කිරීමට සිදුවන්නේ නම් සැලසුම් තුළ සත්වව වාසස්ථාන අතර සම්බන්ධතා නොබිඳෙන ලෙස සත්ව මංපෙත් වෘක්ශලතා තීරු ආදිය ඇතුළත් විය යුතුය. | අදාල නොවේ |
| iii. **ජල සම්පත් සංරක්ෂණය**<br>ජලාපවහනය පාලනය සඳහා සැලසුම් කරන ලද යෝජිත හානි අවම කිරීමේ පියවරයන්හිදී බෑවුම මත ස්වාභාවික උල්පත් වියළී දැයි සලකා බැලිය යුතුය. උල්පත් වියළි ඇති නම් , විපතට පත් පාර්ශ්වයන් සඳහා ස්ථිර විසඳුම් ලබා දිය යුතුය. එවැනි විසඳුම් සැපයීමේදී ජල සැපයුම් මාර්ග සහ ලබාගන්නා ජලය ගබඩා කර (මතුපිට සහ උප පෘෂ්ඨයෙන් වතුර ඉවත් කිරීම) පානීය ජල | අදාල නොවේ |

| | |
|---|---|
| මූලාශ්‍රයන් ලෙස භාවිතා කළ හැකිය. හොඳින් නිර්මාණය කළ සැලැස්මක් තුලින් ලබා ගත් මෙම ජලය සත්ත්ව විශේෂ වලට මෙන්ම අසල්වැසි ප්‍රජාවන්ටද තම පානීය කටයුතු මෙන්ම ස්නානය හා අනෙකුත් ගෘහාශ්‍රිත කටයුතු වලදී පරිභෝජනය සඳහා ප්‍රවේශ විය හැකිය.<br>සමස්ත ජලාපවහන කළමණාකරණ සැළැස්ම එතරම් වැදගත් නොවුවද භූගත ජල මට්ටම අඩු වීම හා වනාන්තරයේ ගස් ඉවත් කිරීම සැලකිල්ලට ගත යුතුය. භූගත ජල මට්ටම මූල කලාපය ඉක්මවා පහලට ගමන් කිරීම හැකිතාක් දුරට මග හැරිය යුතුය | |
| iv. **ස්වභාව සෞන්දර්යාත්මකව ගැලපෙන සැලසුම් සලකා බැලීම**<br><br>සෞන්දර්යාත්මක සංවේදී පරිසර නිර්මාණයේදී ස්වභාවික පරිසරය හා සංකලණය වන එමෙන්ම දෘශ්‍ය හානිය අවම වන ලෙස ව්‍යුහයන් සැලසුම් කිරීමට සැලකිලිමත් විය යුතුය. ඒ සඳහා සුදුසු ස්ථායී ව්‍යහයන් නිර්මාණය කිරීම සඳහා භූ දර්ශන සැලසුම ශිල්පීන්ගේ සේවය වැදගත් වේ. | අඩු |
| v. **හරිත පාරිසරික ලක්ෂණ සලකා බැලීම**<br>බොහොමයක් ආපදා අවම කිරීම් සිදු කරනු ලබන්නේ සංවේදී පරිසර වල බැවින්, පරිසර හිතකාමී හරිත සැලසුම් ගැන සැලකිලිමත් වීම වඩාත් උචිතය. උදාහරණයක් ලෙස: ඛාදනය පාලනය සඳහා දේශීය වෘක්ෂලතා විශේෂ භාවිතා කිරීම, පරිසරයේ විවිධත්වය පවත්වා ගැනීමට ශාක විශේෂ සංයෝජනයන් යොදා ගැනීම. ආක්‍රමණශීලී ශාක විශේෂයන් යොදා නොගැනීම. | අඩු |
| vi. **සේවකයින් / මගීන් සහ ප්‍රජා ආරක්ෂාව**<br>ඉදිකිරීම් අදියර තුළදී නායයෑම් සක්‍රීය වීම සිදු විය හැකි අතර කම්කරුවන්ට සහ මගීන්ට අන්තරාකාරී විය හැකිය. එබැවින් ආරක්ෂිත දැල් වැනි සැලසුම් කළ ආරක්ෂණ ක්‍රම සැලකිල්ලට ගත යුතුය. | ඉහල |
| vii. **අවම පසු නඩත්තු කිරීම් සහ මෙහෙයුම් සැළසුම් කිරීම.**<br>හානිය අවම කිරීමේ කාර්යේදී ජලාපවහන කළමණාකරණය සඳහා ගුරුත්ව කාණු වැනි අක්‍රිය ශිල්ප ක්‍රම (අමතර ශක්ති ප්‍රබවයක් අවශ්‍යා නොවන ) සලකා බැලිය යුතුය. කාණු ඇහිරී යාම වළක්වා ගැනීම සඳහා නිවැරදි පයිප්ප විෂ්කම්භය, සිදුරු වල විෂ්කම්භ සහ ඇතිරීමේ ආනතිය නිවැරදිව සලකා බැලිය යුතුය. කානු ජලය ස්වාභාවික දහරාවන්ට එකතු කරවීමට අපේක්ෂා කරන්නේ නම්, ඛාදනයට ඔරොත්තු දෙන, රොන් මඩ රඳවා ගැනීමේ පද්ධති ආදී නොයෙක් නඩත්තු ව්‍යුහ සැලසුම් කළ යුතුය.<br><br>අධික කාලපරිච්ඡේදයක් තුල දේශීය කාලගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන පරිදි ව්‍යුහයන් සඳහා භාවිතා කරන ද්‍රව්‍ය ප්‍රවේශමෙන් තෝරා ගත යුතුය. වානේ ව්‍යුහයන් භාවිතා කිරීමේදී විශේෂයෙන් විඛාදන වැලකීමේ තාක්ෂණික ක්‍රම සැලසුම් කළ යුතු අතර සියුම් රොන්මඩ උප නළ මාර්ග වලට කාන්දු වීම වැළැක්වීමට පියවර ගත යුතුය. | අධි |
| viii. **ඛාදනය පාලනය කිරීමේ ව්‍යුහයන්හයන්**<br>ජලවහන කළමනාකරණය මගින් ලබාගන්නා ජලය මතුපිට ජල කාණු වලට යොමු කලයුතුය. වැසි කාලවලදී මෙම ජලාපවහනයෙහි සැලකිය යුතු ලෙස ඉහළ යා හැකිය. එබැවින් ඊට ගැලැපෙන ආකාරයට මතුපිට කණු සැකසිය යුතුය. | අඩු |

12.7 **ඉදිකිරීම් අදියර අතරතුර බලපෑම් අවම කිරීම**

**12.7.1 ඉදිකිරීම් අදියර තුළ කොන්තාත්කරුවන්ගේ පාරිසරික හා සමාජ කළමනාකරණ අනුකූල වීම සඳහා වන ප්‍රමිතීන්**

පාරිසරික සහ සමාජීය බලපෑම් අවම කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වන ක්‍රියාමාර්ග සාමාන්‍යයෙන් සියලු නායයාම් අවම කිරීමේ ස්ථාන සඳහා පොදු වේ. මෙම බලපෑම් බොහෝ දුරට ඉදිකිරීමේ කටයුතු වල ක්‍රියාකාරිත්වයට හේතු වේ. එබැවින් ඉදිකිරීමේදී වන බලපෑම අවම කිරීම කොන්ත්‍රාත්කරුගේ යුතුකමකි. ඉදිකිරීම් අදියරේදී කොත්‍රාත්කරුවන්ගේ ලංසු පත්‍රිකාවේ ඇතුලත් කර ඇති පාරිසරික සහ සමාජ සහ සෞඛ්‍යය සහ ආරක්ෂණ (ES & HS) කළමනාකරණයට අනුකූලව කොත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය කෙසේ විය යුතුද යන්න පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සකස් කර ඇත. මෙම කොටස සඳහා අදාළ අංශවල ගුණාත්මක බව දැක්වෙන ප්‍රධාන කොටස් පහත දක්වා ඇත.( වගුව 3). විස්තර සඳහා, ESMP ඉදිකිරීම් කොත්‍රාත්කරුවන් සඳහා යොමු කළ යුතුය.

කොත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත යටතේ ESMP වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ඔහුගේ නිපුණතාවයන් පිළිබඳ නිසි ලේඛන ඉදිරිපත් කළ යුතුය. ESMP සඳහා වන පිරිවැය වෙනම වැටුප් අයිතමයක් ලෙස දැක්විය යුතුය. තෝරාගත් ඉදිකිරීම් කොන්ත්රාත්කරු විසින් පාරිසරික සහ සමාජ කළමනාකරණ ක්‍රම ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු අතර PMU ඒකකය එය අනුමත කිරීමට නියමිතය.

වගුව 3: ES & HS සමඟ අනුකූල වීම සඳහා කොත්‍රාත්කරුගේ අවශ්‍යතාව

| **යොමු අංකය. ඉදිකිරීම් කොන්ත්රාත්කරුවන්ට ESMP** | **අයිතමය** | **අදාල ව්‍යාපෘතියට** |
|---|---|---|
| **2002.** **පාරිසරික හා සමාජ අධීක්ෂණය** | | |
| 2002.2 1) | වැඩ බිම තුල ගබඩා කිරීම | **අතිශයින්ම වැදගත්** (පන්සල, මාර්ග, මහජනතාව) |
| 2002.2 2) | ශබ්ද හා කම්පන | **අතිශයින්ම වැදගත්** (පන්සල ) |
| 2002.2 3) | ගොඩනැගිලි ඉරි තැලීම් හා හානි සිදුවීම | **අතිශයින්ම වැදගත්**(විහාර ගොඩනැගිලි / නිවාස) |
| 2002.2 4) | අපද්‍රව්‍ය බැහැර කිරීම | **අතිශයින්ම වැදගත්** (පන්සල, ඇළ, මාර්ග වෙන් කිරීම) |
| 2002.2 5) | කසළ බැහැර කිරීම | **අතිශයින්ම වැදගත්**(පන්සල, ඇළ, මහජන, මාර්ග) |
| 2002.2 6) | දූවිලි පාලනය | **වැදගත්** |
| 2002.2 7) | ඉදිකිරීම් ද්‍රව්‍ය හා අපද්‍රව්‍ය අපද්‍රව්‍ය ප්‍රවාහනයකිරීම | **වැදගත්** |
| 2002.2 8) | ජලය | **වැදගත්** |
| 2002.2 9) | ශාක හා සත්ව විශේෂ | **අතිශයින්ම වැදගත්**(වනාන්තර) |
| 2002.2 10) | භෞතික හා සංස්කෘතික සම්පත් | **අතිශයින්ම වැදගත්** (පන්සල) |
| 2002.2 11) | පාංශු ඛාදනය | **අතිශයින්ම වැදගත්** |
| 2002.2 12) | පාංශු දූෂණය | **අදාළ** |
| 2002.2 13) | භූමිය හෑරීමේ කටයුතු | **අදාළ** |
| 2002.2 14) | ගල්වල මෙහෙයුම් | අදාළ නොවේ |
| 2002.2 15) | වාහන සහ යන්ත්‍රෝපකරණ නඩත්තුව (දූෂණය) | **වැදගත්** |
| 2002.2 16) | **මහජනතාවට බාධා කිරීම** | **අතිශයින්ම වැදගත්** (පන්සල) |
| 2002.2 17) | **උපයෝගිතා සේවා සහ මාර්ගයේ ඇති පහසුකම්** | **අතිශයින්ම වැදගත්** (පොදු, මාර්ග) |
| 2002.2 18) | **දෘෂ්‍ය පරිසරය වැඩි දියුණු කිරීම** | **අතිශයින්ම වැදගත්** (පන්සල, පොදු, මාර්ග සනීපාරක්ෂක ස්ථාන) |
| **2002.5.** පාරිසරික අධීක්ෂණය | මූලික සමීක්ෂණ (වාතය, ජලය, ශබ්ද, කම්පන, ඉරි තැලීම් සමීක්ෂණ) | **ව්‍යාපෘති** විශේෂිත නිරීක්ෂණ සැලැස්මක් යොමු කරන්න |

| | | |
|---|---|---|
| | ඉදි කිරීම් අතරතුර සමීක්ෂණ (වාතය, ජලය, ශබ්ද, කම්පන, ඉරි තැලීම් සමීක්ෂණ) | **ව්‍යාපෘති** විශේෂිත නිරීක්ෂණ සැලැස්මක් යොමු කරන්න |
| | වැඩබිමේ මෙහෙයුම් කාලය තුල සමීක්ෂණ | **විකල්ප** |
| | වාර්තා කිරීම හා වාර්තා පවත්වාගෙන යාම | අදාළ |
| **2003**. වැඩ කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව (පාසල් සිසුන් සඳහා) | | |
| 2003.2 | සුරක්ෂිත සංවිධානය සහ සන්නිවේදනය | **අතිශයින්ම වැදගත්** |
| 2003.3 | ළමා ශ්‍රමය හා බලකිරීම | **අතිශයින්ම වැදගත්** |
| 2003.4 | ආරක්ෂක වාර්තා සහ අනතුරු පිළිබඳ දැනුම් දීම | **අතිශයින්ම වැදගත්** |
| 2003.5 | ආරක්ෂක උපකරණ සහ ඇඳුම් පැළඳුම් | **අතිශයින්ම වැදගත්** |
| 2003.6 | ආරක්ෂාව පරීක්ෂා කිරීම | **අතිශයින්ම වැදගත්** |
| 2003.7 | ප්‍රථමාධාර පහසුකම් | **අතිශයින්ම වැදගත්** |
| 2003.8 | සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ තොරතුරු සහ පුහුණුව | **අතිශයින්ම වැදගත්** |
| 2003.9 | යන්ත්‍රෝපකරණ සහ සුදුසුකම් ලත් පුද්ගලයන් | **අතිශයින්ම වැදගත්** |

***අදාළ:*** *මෙම වගන්තිය ඕනෑම ව්‍යාපෘති ස්ථානයකට අදාළ පොදු එකක් ලෙස ව්‍යාපෘති ස්ථානයඅදාළ වේ*
***අතිශයින්ම වැදගත්: ESMP*** *අදාලව එම ස්ථානයට නිශ්චිතවම ක්‍රියාත්මක වන පරිදි පාරිසරික ක්‍රමවේදයන් සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විශේෂ අවධානය යොමු කළ යුතුය.*
***ඇතැම් විට අදාල වේ:*** *ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අදාළ ව්‍යපෘති ස්ථානයට පිවිසෙන විට මෙම **ESMP** ක්‍රියාත්මක කරනු ලැබේ*
***අදාළ නොවේ:*** *තොරතුරු අනාවරණය වූ කොන්දේසි යටතේ මෙම ව්‍යාපෘති ස්ථානයට අදාළ විය නොහැක*
***විකල්ප:*** *අවශ්‍ය වන්නේ නම් පමණි*
***ස්ථානීය විශේෂිත නිරීක්ෂණ සැලැස්මක්:*** *කොන්ත්‍රාත්කරුවන් විසින් සඳහන් කර ඇති අධීක්ෂණ අවශ්‍යතා වලට අමතරව **ස්ථානීය** විශේෂිත නිරීක්ෂණ සැලැස්මෙහි සඳහන් පරිදි කොන්ත්‍රාත්කරු විසින් අධීක්ෂණය කිරීම සඳහා බැඳී සිටී.*
***යොමු කිරීම:*** *කොන්ත්‍රාත්කරුවන් **ESMP** ක්‍රියාත්මක කිරීම සඳහා බැඳී සිටී.*

### 12.7.2 ස්ථානීය හානි අවම කිරීම

වගුව 4: ස්ථානීය ES & HS අවම කිරීම සඳහා ගනුලබන පියවර

| හානි අවම කිරීමේ අයිතමය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අදියර | වගකීම් |
|---|---|---|
| **i. ඉදි කිරීම අතරතුර ඛාදනයෙන් සිදුවන බලපෑම අවම කිරීම**<br>වැසි කාලය තුළදී ව්‍යාපෘති ස්ථානය බෑවුම් සකස් කිරිම සුන්බුන් ඉවත් කිරීම ආදී කාර්යයන් සිදු නොකිරීමට නිර්දේශ කර ඇත. එම නිසා වැසි කාලයට පෙර වියළි කාලගුණික තත්ත්වයක දී සිදුකළ හැකි උපරිමය නායයාම අවම කිරීමේ ව්‍යාපෘතිය තුළ ක්‍රියාකාරී ලෙස කටයුතු කිරීම අනිවාර්ය වේ. එමෙන්ම වැසි කාලය තුළ ඉහළ බෑවුමේ කිසිදු ක්‍රියාකාරකමක් සිදුනොකිරීමට නිර්දේශකර ඇත. මෙය සැලසුම් අදියරේ දී සලකා බැලිය යුතුය.පහළ බෑවුමේ ඇති ඇල මාර්ගයට ඉවත දමන රොන්මඩ ඉවත් එකතු වීම වැලැක්වීමටත් පාලනය කිරීමටත් ක්‍රමවේද සකස්කල යුතුය. | **ස්ථාන සකස් කිරීම සහ ඉදිකිරීම** | **ඉදිකිරීම් කොන්ත්රාත්කරු** |
| **ii. ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම**<br>එවැනි අපද්‍රව්‍ය ජනනය කළ හොත් ඒවා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අනුමත ක්‍රමවේදයකට අනුව සෝදා යාමට ඉඩ නොදී ගබඩා කොට තැබිය යුතුය. එමෙන්ම කිසිදු හේතුවක් මත **අපද්‍රව්‍ය** විහාර පරිශ්‍රය තුල තැන්පත් නොකළ යුතුය. එමනිසා කොන්ත්‍රාත්කරු විසින් කළුතර ප්‍රදේශීය සභාව වෙතින් නිර්දේශ කරන ස්ථානයකට කසල බැහැර කිරීමට අනුමැතිය ලබාගත යුතුය. | **ස්ථාන සකස් කිරීම සහ ඉදිකිරීම** | **ඉදිකිරීම් කොන්ත්රාත්කරු** |
| **iii.** ශබ්ද දූෂණය<br>පොහොය දිනවල හා විශාල ජනතාවක් එක් රැස් වන ධර්ම දේශනා පූජාවන් ආදිය පවත්වන දින වලදී අධික ශබ්ද නිකුත් වන ක්‍රියාකාරකම් පාලනය කල යුතුය. එවැනි ක්‍රියාකාරකම් සැලසුම් | **ස්ථාන සකස් කිරීම සහ ඉදිකිරීම** | **ඉදිකිරීම් කොන්ත්රාත්කරු** |

| | | | |
|---|---|---|---|
| | කිරීමට පෙර විහාරස්ථාන හිමියන්ට  පෙර දැනුම් දීමක් සිදු කළ යුතුය. | | |
| **iv.** | කම්පන බලපෑම්<br>පැරණි විහාර ගොඩනැඟිලි වලට හානි වීම වැළැක්වීමට විශේෂිත සීමාවන් තුළ කම්පන උත්පාදන ක්‍රියාකාරකම් සිදු කළ යුතුය. මෙම ගොඩනැඟිලි වල ඉරිතැලීම් ඉදි කිරීමට පෙර, ඉදිකිරීම් අතරතුර සහ ඉන් පසුව නිරීක්ෂණය කළ යුතුය. ගොඩනැගිලිවල සිදුවන ඉදිකිරීම් හානි හේතු / ඉරිතැලීම් නම් සුදුසු පරිදි වන්දි ලබා ගත යුතුය | **ස්ථාන සකස් කිරීම සහ ඉදිකිරීම** | **ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු** |
| **v.** | ඉදිකිරීම් සඳහා ජලය භාවිතය<br>ඉදිකිරීම්  කටයුතු සඳහා අනුමත ස්ථානවලින් පමණක් ජලය ලබාග ගත යුතුය. විහාරස්ථානයට අයත් ජල මාර්ග තුළින් ඉදිකිරීම් සඳහා ජලය ලබා  නොගත යුතු අතර එසේ ලබා ගන්නේ නම් අධිකාරියේ අනුමැතිය ලබාගත යුතුය | **ස්ථාන සකස් කිරීම සහ ඉදිකිරීම** | **ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු** |
| **vi.** | **දූවිලි  සහ දූවිලි ආවරණ**<br>අධික දූවිලි උත්පාදනය වන ක්‍රියාකාරකම්කම් ඉතා සැලකිල්ලෙන් කළ යුතු අතර එවන් අවස්ථාවලදී ප්‍රමාණවත් ලෙස ජලය යෙදීමක් මගින් දූවිලි පාලනයට නිර්දේශ කර ඇත. | **ස්ථාන සකස් කිරීම සහ ඉදිකිරීම** | **ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු** |
| **vii.** | **ඉදිකිරීම් කම්කරුවන් සහ මහජනතාව අතර හැසිරීම් වල සිදුවන නොසන්සුන්තාවයන් කළමනාකරණය කිරීම සහ කම්කරුවන් සඳහා වන** අචාර ධර්ම පද්ධතිය<br><br>**පහත සඳහන් නිර්දේශිත  මත ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කම්කරුවන් හා බැතිමතුන් අතර ඇතිවිය හැකි ගැටළු නිසිලෙස කළමනාකරණය පිළිබඳව කොන්ත්‍රාත්කරු දැනුවත් කළ යුතුය**<br>• නිසි දැනුවත් කිරීම්, ආචාර ධර්ම පද්ධතිය පිළිබඳ අධ්‍යාපනය, අධීක්ෂණය සහ දඬුවම් පැමිණවීම.<br>• විහාරස්ථානය අනෙකුත් ප්‍රදේශව වලින් සීමා වී ඇති ව්‍යාපෘති කලාපය නිර්ණය කිරීම.<br>• නිසි අවසරයකින් තොරව විහාරස්ථාන භූමියට අයත් ජල මූලාශ්‍ර වලින් ජලය ලබාගැනීමට හැකියාව නොමැත.<br>• විහාරස්ථානයට අයත් සනීපාරක්ෂක පහසුකම් භාවිතා කිරීමට සේවකයන්ට අවසර නොමැත එබැවින් **ව්‍යාපෘති** ස්ථානයේ සනීපාරක්ෂක සහ පහසුකම් සේවකයන් වෙත සලසා දිය යුතුය.<br>• කොන්ත්‍රාත්කරු විසින් කිසිදු **ව්‍යාපෘති** කටයුත්තක් සඳහා ළමා ශ්‍රමය යොදා නොගත යුතුය (සෘජුව හෝ වක්‍රව)<br>• අනතුරු විය හැකි අවදානම ඉතා ඉහළ බැවින් යන්ත්‍රෝපකරණ  ක්‍රියාකිරීමේදී බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරුවන් අතිශය පරීක්ෂාකාරී විය යුතුය.<br>• බර යන්ත්‍රෝපකරණ එහා මෙහා කිරීමේදී ආරක්ෂිතව එහා මෙහා යාම සඳහා අවදානම් කලාපය  සඳහා පූර්ණකාලීන මුරකරුවෙකු යොදාගත යුතුය .<br><br>වෙනත්<br>• පෝය දිනවල සහ බෞද්ධ උත්සව දිනවලදී ඉදිකිරීම් කටයුතු සිදු නො නොකළ යුතුය .<br>• විදුලි සැපයුම්  පද්ධතිය, **ව්‍යාපෘති** කළමනාකරණ ඒකකයේ අනුමතයන් පරිදි ආරක්ෂිත ක්‍රම අනුව සකස් විය යුතු අතර විශේෂයෙන් විදුලි කම්පන තුළින් ළමයින්ට සිදුවිය හැකි අනතුරු වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.<br>• **ව්‍යාපෘති** කළමනාකරණ ඒකකයේ අනුමත ස්ථාන තුළ පමණක් වාහන නැවැතීම සහ ගබඩා කිරීම් කටයුතු සිදු කළ යුතුය. | **ස්ථාන සකස් කිරීම සහ ඉදිකිරීම** | **ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු** |

| | | |
|---|---|---|
| • **ව්‍යාපෘති** කාලය තුළ කම්කරුවන් අතර ඇතිවන ආරවුල් තත්ත්වයන් පාලනය කිරීම් සඳහා සහ අධීක්ෂණය සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය.<br>• වැඩබිමේ හැසිරීම පිළිබඳ විශේෂයෙන් මත්පැන් භාවිතය දුම් පානය සෝෂාකාරී හැසිරීම් කාන්තා බැතිමතුන්ට ඇතිවිය හැකි ලිංගික අපයෝජනයන් යන කාර්ණා පිළිබඳ දැඩි පාලනයක් පවත්වා ගත් යුතුය.<br>• සේවකයින් විසින් කිලුටු හෝ පිළිගත නොහැකි ඇඳුමකින් පූජනීය ස්ථානයක ඇතුළුවීම නොකළ යුතුය.එමෙන්ම එවැනි ස්ථානවල වැඩ කරන කාලය අතරතුර විවේක ගැනීම ආදිය ද නොකළ යුතුය. | | |
| **viii.** වැඩ කරන වේලාවන්<br>මෙම ඉදි ඉදිකිරීම් කටයුතු විහාරස්ථානයේ විහාරාධිපති හිමියන්ට අනුකූලව සිදුවිය යුතු අතර ශබ්ද කම්පන හා දූවිලි ජනිත වන ක්‍රියාකාරකම් තුලින් විහාරස්ථානයේ ආගමික කටයුතුවලට බාධා නොවන අයුරින් සිදුවිය යුතුය. රාත්‍රී කාලය තුළ **ව්‍යාපෘති** කටයුතු සිදු කරන්නේ නම් ඒ සඳහා සුදුසු ආරක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය. | **ඉදිකිරීම** | **ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු** |
| **ix.** ආක්‍රමණික විශේෂ<br>පාංශු ඛාදනය වලක්වා ගැනීමට සුදුසු ශාක හෝ තෘණ වර්ග භාවිතා කළ යුතුය.දේශීය පරිසරයට අයත් ආවේණික ශාක වර්ග තෘණ තෝරා ගැනීම සඳහා වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වේ. | **ඉදිකිරීම** | **ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු** |
| **x.** **ඓතිහාසිකව / සංස්කෘතිකව / ආගමිකව වැදගත් වන සොයාගැනීම්.**<br>**ව්‍යාපෘති** කටයුතු තුළදී එවන් අවස්ථාවන් ඇති වුවහොත් කොන්ත්‍රාත්කරු වහාම ඒ බව **ව්‍යාපෘති** කළමනාකරුට දැනුම් දිය යුතුය. | **ඉදිකිරීම** | **ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු** |
| **xi.** අනතුරු ඇඟවීම.<br>**ඉදි කිරීම් අදියර තුළ ආවාස ගොඩනැගිල්ල කඩා ඉවත් කළ යුතුය. එම නිසා ජනතා ප්‍රවේශයන් වැලැක්වීමට හා අධි අවදානම් තත්ත්වයන් වළක්වා ගැනීමට අනතුරු ඇඟවීම් නිසි ආරක්ෂණ සලකුණු යොදා ගත් යුතුය.** | **ඉදිකිරීම** | PMU **සහ විහාරස්ථානයේ ස්වාමීන්වහන්සේ** |
| xii. **අධි අවදානම් ප්‍රදේශවල ජීවත් වන ගෘහ ඒකක**<br>ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නායයෑම් ආපදා අනතුරු ඇඟවීම් වලට ප්‍රතිචාර දක්වමින් අධික වැසි සමයේදී ආගමික ක්‍රියාකාරකම් සහ මහජන රැස්වීම් පැවැත්වීම වළක්වා ඇත. | **ඉදිකිරීම** | PMU **සහ විහාරස්ථානයේ ස්වාමීන්වහන්සේ** |
| **xiii.** **සේවක සෞඛ්‍ය හා ආරක්ෂාව**<br>i. **ව්‍යාපෘති** කාලය අතරතුරදී සේවකයින් අධි අවදානම් තත්ත්වයක් සහිතව වැඩ කළ යුතු බැවින් එම තත්ත්වය වළක්වා ගැනීමට ESMP වගකීම් මත කොන්ත්‍රාත්කරුට නිර්දේශිත අංශ 2003 යටතේ " ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව හා සේවා කොන්දේසි" ඉතා සැලකිලිමත්ව හා මනා කළමණාකාරීත්වයකින් යුතුව ආරක්ෂිත අධීක්ෂණ පද්ධතියක් මත පවත්වාගෙන යා යුතුය.<br>ii. වැසි සමයේ අස්ථාවර බෑවුම් මත වැඩ කිරීම් ඉතා අවදානම් බැවින් වැසි කාලයේ **ව්‍යාපෘති** කටයුතු සිදු සිදු කිරීම අත්හිටුවීමට වීමට කටයුතු කළ යුතුය.<br>iii. කම්කරුවන්ගේ හා ප්‍රජාවගේ ආරක්ෂාව සඳහා උසස් තත්වයේ අනතුරු ඇඟවීමේ පද්ධතියක් සහ පූර්ණ කාලීන මුරකාවල් යොදාගැනීමයොදාගැනීමට තරයේ නිර්දේශ කොට ඇත.<br>iv. කම්කරුවන් හා මාර්ගය භාවිතා කරන්නන් මත කළු ගල් පෙරළීමේ අවදානම වළක්වා ගැනීමට ආරක්ෂිත බාධක හා දැල් ස්ථාපිත කිරීම් අනිවාර්ය වේ | **ඉදිකිරීම** | **ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු** |

| | | | |
|---|---|---|---|
| v. | සේවකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් සපයා දිය යුතු අතර, සනීපාරක්ෂක අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කළ යුතුය. | | |
| **xiv.** | ගිනි ගැනීම් හා ලැව් ගිනි ඇතිවීම<br>විදුලි පද්ධතිය ස්ථානගත කිරීමේදී විදුලිය කාන්දු වීම් හා පිපිරීම් වළක්වා ගැනීමට ඉතා සුපරික්ෂා සුපරික්ෂාකාරී විය යුතු අතර ඉදිකිරීම් අතරතුරදී ගිනි තැබීම් තහනම් වේ. | **ඉදිකිරීම** | **ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු** |

## 13. ව්‍යාපෘති ස්ථානය අධීක්ෂණය කිරීම

ඉදිකිරීම් අදියර තුළ පහත සඳහන් අධීක්ෂණ සැලැස්ම නිර්දේශ කර ඇත

වගුව 5: පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලසුම; ඉදිකිරීම් අදියර

| **අධීක්ෂණ අවශ්‍යතා** | **පරාමිතීන්** | **පරික්ෂා කලයුතු වාර ගනන** |
|---|---|---|
| මූලික නිරීක්ෂණ | ජලයේ ගුණාත්මකභාවය | - |
| | පන්සල් ගොඩනැඟිලි වල පූර්ව ඉරිතැලීම් සමීක්ෂණය (පිළිමගෙය) | එක් වරක් * |
| | වාතය ගුණාත්මකභාවය: අංශු | එක් වරක් * |
| | භූ කම්පන | එක් වරක් * |
| | පසුබිම් ශබ්දය මැනීම | එක් වරක් * |
| ඉදිකිරීම් අතරතුර | අධි අවදානම් පාසැල් ගොඩනැගිලි පිළිබඳ ඉරිතැලීම් සමීක්ෂණය | ඉදිකිරීම් තුළදී සැලකිය යුතු විස්ථාපන(ඇත් වීම්)පවතී ** |
| | භූ කම්පන | කැණීම් යන්ත්‍රෝපකරණ, පිපිරවීම, හෝ භූ කම්පන ජනනය කරන ඕනෑම ක්‍රියාවක දී * |
| | ඉදිකිරීම් ශබ්දය | අධික ඝෝෂාකාරී අවස්ථාවලදී මාසයකට වරක් * |
| | වායු ගුණාත්මක අංශු | මසකට වරක් * |
| | කුඩා වාසස්ථාන ඇගයීම | එක් වරක් *** |
| වායු විමෝචනය | අදාළ සියලු යන්ත්‍රෝපකරණ / වාහන ක්‍රියාත්මක වන පරිදි විමෝචන පාලන පරීක්ෂණ සහතිකය තිබිය යුතුය - උපදේශකයාගේ ව්‍යාපෘති ස්ථානයES විසින් පරීක්ෂා කළ යුතුය | |
| නිරීක්ෂණ ආයතනය | * ඉරිතැලීම් සමීක්ෂණය හැර අනෙකුත් සියලුම පරාමිතීන් අධ්‍යානය සඳහා මධ්‍යයම පරිසර අධිකාරියේ ලියාපදිංචි ස්වාධීන නිරීක්ෂණ ආයතනයක් යොදා ගත යුතුය.<br>** PMU අනුමත ආයතනයක් මගින් ඉරිතැලීම් සමීක්ෂණය පැවැත්විය යුතුය<br>*** FD හි අවශ්‍යතාවය මත PMU හි අනුමැතියෙන් තෝරාගත් තරගකාරී ආයතනයක් මගින් කුඩා වාසස්ථාන ඇගයීම තක්සේරු කළ යුතුය | |
| අවශ්‍යතා වාර්තා කිරීම | **ගංගා ජල ගුණාත්මය -** මධ්‍යයම පරිසර අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද පාරිසරික ජල තත්ත්ව ප්‍රමිතීන් සමග සැසඳීම, 2017<br>**ඉහල අවදානමක් සහිත ගොඩනැඟිලිවල ඉරිතැලීම් සමීක්ෂණය** - වෘත්තිමය වාර්තාවක් යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම් ක්‍රියාකාරකම් සහ වාහන ගමන්, CEA සඳහා කම්පනය පිළිබඳ අන්තර් ප්‍රමිතීන් අනුව භූමි දෙදරුම් කම්පනය<br>**පසුබිම් ශබ්දය මැනීම** - අතිරේක ගැසට් අංක 924.1, මැයි 23,1996, මධ්‍යයම පරිසර අධිකාරිය<br>**වායු ගුණාත්මය (අංශු පරීක්ෂාව)-** 2008 අගෝස්තු මස 15 වන දින අංක 1562/22 දරන **අති විශේෂ ගැසට් නිවේදනය යටතේ ජාතික පරිසර උෂ්ණත්ව තත්ත්වයන් -** මධ්‍යයම පරිසර අධිකාරිය.<br>**කුඩා වාසස්ථාන ඇගයීම**: TOR හි FD අනුව කුඩා වාසස්ථාන තක්සේරු වාර්තාව: කුඩා වාසස්ථාන මත ඇතිවන බලපෑම අවම කිරීම | |

## 14. දුක් ගැනවිලි වලට සවන් දීම

පහත සඳහන් විය හැකි බලපෑම් සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් මෙම **ව්‍යාපෘතියේ** දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම සඳහා උපදේශකවරුන් වන ES නිලධාරියා වගබලා ගත යුතුය. (අ) විහාරාධිපති හිමි ආ) අසල නිවාසවල පදිංචිකරුවන්. (යොමුකිරීම: **දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම සඳහා නිර්දේශිත ක්‍රියා පටිපාටිය සඳහා පරිසර හා සමාජ කළමනාකරණ රාමුව**).එසේම, විහාරස්ථානය තුළ දුක්ගැනවිලි ලිඛිතව ඉදිරිපත් කිරීමට ඒවා බහාලන පෙට්ටියක් තබා ගැනීම නිර්දේශ කර ඇත

## 15. තොරතුරු අනාවරණය කිරීම

පහත දැක්වෙන ආයතන සහ සංවිධාන අනුව ලකුණු කරන ලද ආකෘති මගින් ES තොරතුරු අනාවරණය කිරීමට PMU හි වගකීම වේ.

වගුව 6: තොරතුරු අනාවරණය කිරීමේ යෝජිත සැළැස්ම

| තොරතුරු | යෝජිත ආයතන | තොරතුරු අනාවරණය කිරීමේ ක්‍රමවේදය |
|---|---|---|
| i. ව්‍යාපෘති සැලැස්ම (ස්ථානීය තොරතුරු, සැලසුම, ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන) | දිස්ත්‍රික් මධ්‍යයම පරිසර අධිකාරිය,DFC, DWLC, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම්,RDA, රාජ්‍ය ඉඩම් හිමියන්, අනෙකුත් දිස්ත්‍රික මට්ටම් නියෝජිතායතන, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාලය, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, ගිවිසුම්, අනුමැතීන් සහ කැමැත්ත සඳහා අත්සන් කිරීම සඳහා අදාල වාර්තාව ඉදිරිපත් කිරීම. |
| ii. පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්ම | දිස්ත්‍රික් මධ්‍යයම පරිසර අධිකාරිය, DFC, DWLC, AIIB, පාසලේ විදුහල්පති | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, ගිවිසුම්, අනුමැතීන් සහ කැමැත්ත සඳහා අත්සන් කිරීම සඳහා අදාල වාර්තාව ඉදිරිපත් කිරීම |
| iii. ප්‍රගති වාර්තා (මූලික හා ඉදිකිරීම් කාලය තුළ) | දිස්ත්‍රික් මධ්‍යයම පරිසර අධිකාරිය, DFC, DWLC, AIIB සහ අදාළ පාර්ශ්වයන් සුදුසු පරිදි | ප්‍රගති රැස්වීම්, විශේෂ රැස්වීම්, අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |
| iv. පාරිසරික අනුකූලතා සේවකයින් සෞඛ්‍ය හා ආරක්ෂාව සඳහා ස්ථාන පරීක්ෂා කිරීම | දිස්ත්‍රික් මධ්‍යයම පරිසර අධිකාරිය, DFC, DWLC, RDA , ප්‍රාදේශීය ලේකම්, පොලිස්, රාජ්‍ය ඉඩම් හිමියන්, ගාම නිලධාරී, දිස්තික් කාර්යාලය NBRO, AIIB හා අදාළ පාර්ශ්වයන් | ලිඛිත හා වාචික සන්නිවේදනය, අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |
| v. එ.ජා.ර.ස.ට අදාළ තීරණ හා ප්‍රගති සමාලෝචන රැස්වීම් | දිස්ත්‍රික් මධ්‍යයම පරිසර අධිකාරිය, DFC, DWLC, RDA, ප්‍රාදේශීය ලේකම්, පොලීසිය, රජයේ ඉඩම් හිමියන්, ග්‍රාම නිලධාරී, දිස්ත්‍රික් කාර්යාලය NBRO, AIIB | රැස්වීම්, අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |
| vi. දුක් ගැනවිලි විසඳීමේ යාන්ත්‍රනය | අදාල පාර්ශ්වයන්, AIIB | රැස්වීම්, ලිඛිත හා වාචික සන්නිවේදනය |

**වගුව 7: තොරතුරු රැස්කර ගැනීම සඳහා සම්බන්ධකර කරගත් ආයතන සහ නිලධාරීන්**

| දිනය | ආයතනය | තොරතුරු සඳහා සම්බන්ධ වූ පුද්ගලයා |
|---|---|---|
| 27/09/2018 පැය 11.30 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | උපුල් විජයන්ත මහතා - අඩවි වන නිලධාරී |
| 05/10/2018 පැය 14.00 | මධ්‍යයම පරිසර අධිකාරිය | චද්‍රිකා හේවගේ මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂිකා - CEA කළුතර දිස්ත්‍රික්කය |

## *ඇමුණුම I: ආපදා තත්ත්වයේ ස්වභාවය හා උපදේශන අවස්ථා*

| | |
|---|---|
|  |  |
| රූපය *a:* නියෝජ්‍යය කම්කරු කොමසාරිස් *R.W.M* පොඩිනිලමේ මහතා සමඟ සිදුකල සාකච්ඡාව | රූපය *b:* දායක සභාවේ සභාපතිනි *S.* මද්දුමබණ්ඩාර මහත්මිය සමඟ සිදුකල සාකච්ඡාව |
|  |  |
| රූපය *c:* කුමරි කන්ද විහාරස්ථානයේ ඉපැරණි බෝධි වෘෂය | රූපය *d:* නාය යාමට ලක් වූ බෑවුමේ ඉහල කොටසේ පිහිටා ඇති විහාරස්ථානයේ ධර්ම ශාලාව |
|  |  |
| රූපය *e:* විහාරස්ථානයේ චෛත්‍ය සහ බුදු මැදුර | රූපය *f:* විහාරස්ථානයේ සිට අවට දිස්වන අලංකාරය |

*ඇමුණුම* ***II:*** *පාර්ශවකරුවන් සමග පැවැත්වූ සාකච්ඡා තුලදී අනාවරණය වූ විශේෂ කරුණු - කළුතර දිස්ත්‍රික්කය*

| දිනය: 27/09/2018 සහ 05/10/2018 | | |
|---|---|---|
| ආයතනය | සම්බන්ධීකරණ නිලධාරීගේ නම සහ තනතුර | ඉදිරිපත් වූ සැලකිය යුතු කරුණු |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | උපුල් විජයාන්ත මහතා<br>අඩවි වන නිලධාරී | ✓ මෙම ආපදා ස්ථානය සඳහා අදාල නොවේ. |
| මධ්‍යයම පරිසර අධිකාරිය | චන්ද්‍රිකා හේවගේ මහත්මිය<br>නියෝජ්‍යය අධ්‍යක්ෂිකා - CEA කළුතර දිස්ත්‍රික්කය | ✓ මධ්‍යයම පරිසර අධිකාරිය ව්‍යාපෘතියට විරුද්ධ නැත<br>✓ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා නිර්දේශයක් අවශ්‍ය නොවේ |

*ඇමුණුම* ***III:*** *අධ්‍යයන කණ්ඩායම*

| නම | තනතුර | අධ්‍යන කාර්යය |
|---|---|---|
| TDSV ඩයස් | අධ්‍යයක්ෂ / ESSD / NBRO | කණ්ඩායම් නායක |
| SAMS දිසානායක | ජ්‍යේෂ්ඨ විද්‍යාඥ / ESSD / NBRO | ජ්‍යේෂ්ඨ පරිසර විද්‍යාඥ |
| ප්‍රභාත් ලියනආරච්චි | විද්‍යාඥ / ESSD / NBRO | පාරිසරික විද්‍යාඥ |
| H කුසලසිරි | තාක්ෂණික නිලධාරි / ESSD / NBRO | GIS / ජනගහන දත්ත / සමීක්ෂණ ආධාර |
| හර්ෂ ඒකනායක | ස්ථාන භාර නිලධාරී-කළුතර දිස්ත්‍රික් කාර්යාලය | භූ විද්‍යාඥ |

*ඇමුණුම* ***IV:*** *විමර්ශන ලැයිස්තුව*

1. කුමරි කන්ද නායයෑම් පිළිබඳ ජා.ගො.ප සංවිධානයේ ශේෂ්ත්‍ර වාර්තාව
2. ගෝලීය පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම් - ශ්‍රී ලංකා නායයාම් අවම කිරීමේ ව්‍යාපෘතිය - **AIIB**
3. පරිසර හා සමාජ කළමනාකරණ රාමුව - ශ්‍රී ලංකා නායයාම් අවම කිරීමේ ව්‍යාපෘතිය - **AIIB**
4. නැවත පදිංචි කිරීමේ සැලසුම් රාමුව - ශ්‍රී ලංකා නායයාම් අවම කිරීමේ ව්‍යාපෘතිය -**AIIB**